ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් - 2024

------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ (“මණ්ඩලය”) සහ එහි පරිපාලිත සමාගම්වල (“සමූහය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පරිපාලිත සමාගම් වන එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් සහ ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදි.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමූහයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියා කර ඇති බව,

- සමූහය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී .ලං.ගි.ප්‍ර 01) 69 වැනි වගන්තියට පටහැනිව, තොග ශේෂය යටතේ පෙන්වීම වෙනුවට රු. මිලියන 476.77 ක් වූ තොග ගැලපුම් ගිණුමේ හර ශේෂය වෙනත් ණය ගැතියන් යටතේ ද, රු. මිලියන 465.96 ක් වූ තොග ගැලපුම් ගිණුමේ බැර ශේෂය වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ ද පෙන්වා තිබුණි. තවද, ඉහත තොග ගැලපුම් ශේෂයන් අතරින් තොග හිඟයට අදාළ රු. මිලියන 142.38 ක් වූ හර ශේෂය සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 89.2 ක් වූ බැර ශේෂය වසරකට වැඩි කාලයක සිට තොග ගැලපුම් ගිණුමේ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. | විෂමතා විසඳන තෙක් සත්‍යාපිත තොග වටිනාකම සහ ලෙජර වටිනාකම අතර වෙනස තොග ගැලපුම් ගිණුමේ හඳුනාගෙන ඇත. අපගේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සහ වඩාත් නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා, සත්‍යාපන ක්‍රියාවලියේදී හඳුනාගත් කිසියම් තොග අතිරික්තයක් වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් යටතේ සටහන් කරන අතර, කිසියම් තොග හිඟයක් අනෙකුත් ණයගැතියන් යටතේ සටහන් කරයි. මෙම ප්‍රවේශය මගින් මූල්‍ය ප්‍රකාශනවල අපගේ තොග සහ අදාළ මූල්‍ය තත්ත්වයන්හි සත්‍ය තත්ත්වය සාධාරණ ලෙස නියෝජනය කරන බව සහතික කෙරේ. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාළව ශ්‍රී .ලං.ගි.ප්‍ර 01 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ) | තොග (ශ්‍රී .ලං.ගි.ප්‍ර 02) සහ දේපළ, පිරියත හා උපකරණ (ශ්‍රී .ලං.ගි.ප්‍ර 16) පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පිළිවෙලින් එකතුව රු. මිලියන 3,075.31 ක් සහ රු. මිලියන 6,955.76 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිල විචලනයක් පැවති බව හෙළිදරව් විය. එසේම, එකතුව | තථ්‍ය මිල ගණන් සහ සම්මත මිල ගණන් අතර පරතරය අවම කිරීම සඳහා මිලකරණ කමිටුවට සම්මත මිල ගණන් ද්වි-වාර්ෂිකව සමාලෝචනය කරන ලෙස උපදෙස් දෙන ලදි. ඉහත කරුණුවලට අමතරව, ලංවිම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක පවතින අතර ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ඒ ඒ සමාගම් විසින් බරිත සාමාන්‍ය තොග තක්සේරු කිරීමේ ක්‍රමය සමඟ ERP පද්ධතිය ක්‍රියාත්මක කළහොත් මෙම ගැටළු ඉවත් වනු ඇත. තවද, ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් | තොගවල පිරිවැය හඳුනා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී .ලං.ගි.ප්‍ර 02 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු. මිලියන 7,690.87 ක් වූ අහිතකර ගබඩා මිළ විචලනයක් පැවතුණි. ඒ අනුව, අවශ්‍ය තොරතුරු විගණන සඳහා ලැබී නොමැතිවීම හේතුවෙන් ඉහත විචලනයන් මගින් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය. | සඳහා පොදුකාර්ය පිරිවැය අවශෝෂණය කර ගැනීම සඳහා වෙන් කිරීමේ ක්‍රමයක් තිබිය යුතුය. | |
| (ඇ) | දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී .ලං.ගි.ප්‍ර 16) 51 වැනි වගන්තියට අනුව, වත්කම්වලප්‍රයෝජනවත්ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (ශ්‍රී .ලං.ගි.ප්‍ර 08) අනුව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවමත් භාවිතා කරනු ලබන රු. මිලියන 213,362 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ලංවිම හි වත්කම්වලප්‍රයෝජනවත්ආයු කාලය පිළිබඳ වාර්ෂික සමාලෝචනය ප්‍රායෝගික නොවන සැලකිය යුතු කටයුත්තකි. තවද, ලංවිම රු. බිලියන 955 ක වත්කම් පදනමක් ඇති සංවිධානයක් වන අතර විදුලි බලාගාර සහ සම්ප්‍රේෂණ මාර්ග වැනි ප්‍රධාන වත්කම් සංරචකවල සුවිශේෂත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින් වත්කම්වලප්‍රයෝජනවත්ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීම පහසු සහ ප්‍රායෝගික නොවේ. කෙසේ වෙතත්, වර්තමානයේ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශයේ පිහිටුවා ඇති විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ සම්බන්ධීකරණ කාර්යාලයේ (PSR) උපදෙස් පරිදි, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව (අ) ඉඩම් සහ ගොඩනැගිලි (ආ) වාහන (ඇ) ජාල වත්කම් සහ (ඇ) අනෙකුත් වත්කම් වෙන වෙනම තක්සේරු කිරීම සඳහා පත් කරන ලද උප කමිටු ඇත. එබැවින්, සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්, ඒවායේප්‍රයෝජනවත්ආයු කාලය වෙනස් වීමත් සමඟ නැවත තක්සේරු කරනු ලබන අතර, ඒ අනුව අවශ්‍ය ගිණුම්කරණ සටහන් යොදනු ලැබේ. | මණ්ඩලය විසින් දැනටමත් භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී .ලං.ගි.ප්‍ර 16 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඇ) | ශ්‍රී .ලං.ගි.ප්‍ර 08 ප්‍රමිතියේ 41 සහ 42 වගන්තිවලට පටහැනිව, 2019 සිට 2023 දක්වා කාලය තුළදී ආනයනය කරන ලද ගල් අඟුරු නැව් බඩු තොග සඳහා ප්‍රමාද ගාස්තු ලෙස ගෙවන ලද රු. මිලියන 563.53 ක මුදලක් සහ පුත්තලම ගල් අඟුරු ව්‍යාපෘතියඅදියර II හිකොන්ත්‍රාත්ගිවිසුමේ විධිවිධාන අනුව චීන යන්ත්‍රෝපකරණ ඉංජිනේරු සංස්ථාව (CMEC) වෙනුවෙන් 2015/16 තක්සේරු වර්ෂය සඳහා මණ්ඩලය විසින් පියවන ලද රු. මිලියන 40.58 ක | සටහන් කර ගන්නා ලදි. | පෙර වර්ෂයේ ගැලපීම් සිදු කිරීමේදී ශ්‍රී .ලං.ගි.ප්‍ර 08 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයතනික ආදායම් බද්ද, අතීතානුයෝගීව ගැලපීම් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි. | | |
| (ඉ) | 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ සිට 2023 අගෝස්තු දක්වා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමට විදුලිය සැපයීම මත මණ්ඩලය විසින් රු. මිලියන 1,224 ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් (SSCL) අය කර තිබුණි. කෙසේ වෙතත්, 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 3(2)(ඇ) වගන්තියේ පළමු උපලේඛනයේ 2 වන කොටසේ දක්වා ඇති විධිවිධාන මත පදනම්ව සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (ලෙකෝ) එම බදු ගෙවීම ප්‍රතික්ෂේපකර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය එම බදු මුදල ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී .ලං.ගි.ප්‍ර 08 ප්‍රමිතියේ 41 සහ 42 වගන්තිවලට අනුකූලව එම ගෙවූ බදු මුදල අතීතානුයෝගීව ගැලපීම් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ලාභයට අය කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ සමාලෝචිත වර්ෂය ආරම්භයේ රඳවා ගත් අලාභය එකම වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි. | PUCSL හි අනුමැතිය ඇතිව, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් 2024 වර්ෂයේදී SSCL වගකීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සම්පූර්ණයෙන්ම පියවන ලදි. එබැවින් වත්මන් කාලපරිච්ඡේද තුළදී ගනු ලැබූ නියාමන තීරණයක ප්‍රතිඵලයක් ලෙස SSCL පිරිවැය සමාලෝචිත වර්ෂය සඳහා ලාභයට අය කරන ලදි. | පෙර වර්ෂයේ ගැලපීම් සිදු කිරීමේදී ශ්‍රී .ලං.ගි.ප්‍ර 08 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඊ) | 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පැහැර හරින ලද බදු වාර්තාවට අනුව, 2015/2016 තක්සේරු වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා ගෙවිය යුතු ආයතනික ආදායම් බදු, උපයන විට ගෙවන බදු සහ එකතු කළ අගය මත බදු පිළිවෙලින් රු. මිලියන 36.62 ක්, රු. මිලියන 621.57 ක් සහ රු. මිලියන 70.64 ක් වූ අතර මණ්ඩලය විසින් අභියාචනා ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් තීරණයක් ලැබී නොතිබුණි. එසේ වුවද, ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී .ලං.ගි.ප්‍ර 12) 88 වැනි වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල එය අනාවරණය කර නොතිබුණි. | මෙම අවස්ථාවේදී, සලකා බලනු ලබන බදු සහ දඩ මුදල් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවලට යටත් වේ. මෙම අභියාචනා සඳහා අවසාන තීරණයන් ලැබීමට නියමිත අතර, මෙම මුදල් ගෙවිය යුතු බවට තවමත් තහවුරු කර නොමැත. මෙම මුදලට එරෙහිව කටයුතු කිරීමට සාධාරණ හේතු ඇති බව ලංවිම විශ්වාස කරන අතර, අභියාචනාවල ප්‍රතිඵලය මෙම වගකීම් ආපසු හැරවීමට හේතු විය හැක. | බදු සම්බන්ධයෙන් නොවිසඳුණු ආරවුල් හෙළිදරව් කිරීමේදී ශ්‍රී .ලං.ගි.ප්‍ර 12 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මණ්ඩලයේ වත්කම්වල ධාරණ අගය එහි බදු පදනම ඉක්මවා තිබුණද, ශ්‍රී .ලං.ගි.ප්‍ර 12 හි 15 සහ 16 වන වගන්ති සහ මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 2.4.3 වගන්තියට | වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ දී ලංවිම සතුව ඉදිරියට ගෙන යා හැකි සැලකිය යුතු බදු අය කළ හැකි අලාභ පවතී. මෙම අලාභ අනාගත බදු අය කළ හැකි ලාභ පියවා ගැනීමට | මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත බදු ප්‍රතිපාදන හඳුනා ගැනීමට අදාළව ශ්‍රී .ලං.ගි.ප්‍ර 12 හි |

| | | | |
|---|---|---|---|
| | අනුව, දේපළ, පිරියත හා උපකරණවල බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත බදු බැරකම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | අපේක්ෂා කරන අතර, එමඟින් හඳුනාගත් බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් (දේපල, පිරියත හා උපකරණවල) නුදුරු අනාගතයේදී තථ්‍ය බදු බැඳීම් ඇති කිරීමේ හැකියාව අවම කරයි. එබැවින්, විලම්බිත බදු බැරකම් හඳුනා නොගැනීමේ තීරණය ශ්‍රී .ලං.ගි.ප්‍ර 12 හි විධිවිධාන සමඟ සමපාත වේ. වෙනස්වන බදු සහ මූල්‍ය තත්වයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මෙම ස්ථාවරය වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි. | විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඖ) | 2024 ජූනි 27 දින සහතික කරන ලද 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වන අතර පනතේ 17 වන වගන්තියේ 01 වන උපලේඛනයට අනුව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම් 12 ක් සංස්ථාපනය කිරීමට යෝජනා කෙරේ. කෙසේ වෙතත්, ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (ශ්‍රී .ලං.ගි.ප්‍ර 37) මගින් අවශ්‍යකරන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | 14 වන සහ 72 වන වගන්තියේ සඳහන් ප්‍රතිපාදනයක් සඳහා හඳුනාගැනීමේ නිර්ණායක සම්පූර්ණයෙන් සපුරා නොමැති අතර 2024 මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අවසන් කරන විට සවිස්තරාත්මක ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම සංවර්ධනය කරමින් පැවති අතර මූල්‍ය බලපෑමේ ප්‍රමාණය තවමත් විශ්වාසදායක ලෙස තීරණය කර නොමැත, එබැවින් කිසිදු ප්‍රතිපාදනයක් හඳුනාගෙන නොමැත. කෙසේ වෙතත්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 1.1 යටතේ ප්‍රතිව්‍යුහගත කිරීම දැනට සිදුකරමින් පවතින බව සඳහන් කරමින් කෙටි හෙළිදරව් කිරීමක් කර ඇත. | ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කිරීමේදී ශ්‍රී .ලං.ගි.ප්‍ර 37 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (එ) | ලද තොරතුරුවලට අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ මහාධිකරණයේ ගොනු කර තිබූ නඩු හතරක් සඳහා අධිකරණ තීන්දු 2024 දෙසැම්බර් 31 වන දිනට ප්‍රකාශයට පත් කර තිබුණි. අධිකරණ තීන්දුවට අනුව, සමාගම් දෙකකට (හෙළදනවි ලිමිටඩ් සහ මේඩා නිෂිමට්සු බද්ධ ව්‍යාපාර සමාගම) රු. මිලියන 1,387.95 ක වන්දි මුදලක් ගෙවීමට සහ මණ්ඩලය විසින් පොරොන්දු වූ පිරිවිතරයන්ට අනුව තලවකැලේ දෙමළ මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට නියම කරන ලදි. කෙසේ වෙතත්, ශ්‍රී .ලං.ගි.ප්‍ර 37 වන ප්‍රමිතියේ 14 වන වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. | **හෙළදනවි සමාගමේ ශ්‍රේෂ්ඨාධිකරණ කාරණය**<br>ඉහත කරුණ සම්බන්ධයෙන්, වාණිජ මහාධිකරණයේ තීන්දුවට එරෙහිව ලංවිම විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනයක් ගොනු කර තිබූ අතර, 2024 නොවැම්බර් 12 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද ලංවිමේ අභියාචනය ප්‍රතික්ෂේපකරන ලදි. එම තීන්දුවට අනුව, ලංවිම විසින් පොලිය සමඟ රු. 215,203,184 ක් සහ රු. 2,315,924 ක් ගෙවිය යුතුය.<br><br>**මේඩා නිෂිමට්සු බද්ධ ව්‍යාපාර සමාගමේ කාරණය**<br>නඩු අංක ඒ.ආර්.බී 371/2021 සහ 480/2021 සඳහා වන මහාධිකරණ නියෝගයට අනුව, ලංවිම විසින් මේඩා නිෂිමට්සු සමාගමට ආසන්න වශයෙන් රු. 1,170,429,273 ක් ගෙවීය යුතුය. | අධිකරණ තීන්දු අනුව ගෙවිය යුතු වන්දි සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | **තලවකැලේ දෙමළ මහා විද්‍යාලයේ ශ්‍රේෂ්ඨාධිකරණය කාරණය**<br><br>ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට අනුව, ලංවිම විසින් තලවකැලේ දෙමළ මහා විද්‍යාලය වෙනුවෙන් නව ශ්‍රවණාගාරයක් ඉදිකළ යුතුය.<br><br>2025 මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ප්‍රතිපාදන සලසනු ඇත. | |
| (ඒ) 2024 ඔක්තෝබර් 14 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමට අනුව, යෝජිත ඒකල කොටුමා උපපොළ ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට අයත් ඉඩමේ කොටසක් රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත පදනම්ව රු. මිලියන 320 ක් අයකර ගනිමින් මණ්ඩලයට පැවරීමට තීරණය කරන ලදි. තවද, 2023 සැප්තැම්බර් 18 වන දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, රු. මිලියන 80 ක මුදලක් (ඉඩමේ ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 25 ක්) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට (ජා-ඇල) අත්තිකාරම් ගෙවීමක් ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී .ලං.ගි.ප්‍ර 37 වන ප්‍රමිතියේ 14 වන වගන්තියට අනුව වර්ෂය අවසන් වන විටත් ඉඩම අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු ඉතිරි රු. මිලියන 240 සඳහා මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. තවද, 2025 මාර්තු මස අවසන් වන විටත් එම කාර්යය සඳහා ඉඩම අත්පත් කර ගෙන නොතිබුණි. | | මෙම කරුණ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වර්තමාන බැඳීම් සඳහා ප්‍රතිපාදන සැලසීම සම්බන්ධයෙන් ශ්‍රී .ලං.ගි.ප්‍ර 37 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඔ) බෙදාහැරීමේ අංශය 04 හි වර්ෂ එක සිට පහ දක්වා කාලයක සිට හිඟව පවතින අනෙකුත් ණයගැතියන් (විවිධ ණයගැතියන් සහ නොමිලේ සපයන සේවා සම්බන්ධතාවය) රු. මිලියන 82.13 ක් විය. කෙසේ වෙතත්, 2025 ජනවාරි 21 දිනැති ගිණුම් චක්‍රලේඛ අංක 651 හි විධිවිධානවලට පටහැනිව, හානිකරණය සඳහා ප්‍රතිපාදන ලෙස රු. මිලියන 31.49 ට සමාන මුදලක් පමණක් ගිණුම්ගත කර තිබුණි. ඒ හා සමානව, බෙදාහැරීමේ අංශය 03 සහ බෙදාහැරීමේ අංශය 04 හි වර්ෂ පහකට වැඩි කාලයක සිට හිඟව පවතින අනෙකුත් ලැබිය යුතු මුදල් පිළිවෙලින් රු. මිලියන 8.86 ක් සහ රු. මිලියන 53.78 ක් විය. කෙසේ වෙතත්, | | **එක් එක් සිද්ධියෙන් සිද්ධියට අපේක්ෂිත ණය අලාභ විශ්ලේෂණයට අනුව අනෙකුත් ණයගැතියන් සඳහා ප්‍රතිපාදන සිදු කරනු ලබයි.**<br><br>**බෙදාහැරීමේ අංශය 01**<br>**අනෙකුත් ණයගැති ශේෂය**<br>බෙදාහැරීමේ අංශය 01 හි වර්ෂ එක සිට පහ දක්වා කාලයක සිට හිඟ ණයගැති ශේෂය ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයතනවලට අයත් වන අතර එහි වටිනාකම රු. මිලියන 113.54 ක් වේ. හිඟ මුදල් අයකර ගැනීම සඳහා අදාළ රාජ්‍ය ආයතන වෙත සිහි කැඳවීමේ ලිපි යවා ඇත. එබැවින්, වර්ෂ එක සිට පහ | හානිකරණය සඳහා ප්‍රතිපාදන සැලසීම සම්බන්ධයෙන් ශ්‍රී .ලං.මූ.වා.ප්‍ර 09 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හානිකරණය සඳහා ප්‍රතිපාදන ලෙස රු. මිලියන 20.91 කට සහ රු. මිලියන 11.79 කට සමාන මුදලක් පමණක් ගිණුම්ගත කර තිබුණි. තවද, බෙදාහැරීමේ අංශය 01 සහ වත්කම් කළමනාකරණ අංශයේ වර්ෂ එක සිට පහ දක්වා කාලයක සිට හිඟව පවතින අනෙකුත් ලැබිය යුතු මුදල් ශේෂය පිළිවෙලින් රු. මිලියන 96.06 ක් සහ රු. මිලියන 41.17 ක් විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය (ශ්‍රී .ලං.මූ.වා.ප්‍ර - 09) අනුව අපේක්ෂිත ණය අලාභය හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල හානිකරණය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. මෙම නිරීක්ෂණ හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය වත්කම්වල ධාරණ අගයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | දක්වා වයස්ගත ණයගැති ශේෂයන් සඳහා ප්‍රතිපාදන සලසා නොමැති අතර, වර්ෂ පහකට වැඩි හිඟ මුදල් සඳහා ප්‍රතිපාදන සලසා ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 03**<br>**විවිධ ණයගැතියන් සහ නොමිලේ සපයන සේවා සම්බන්ධතාවය**<br>රු. මිලියන 228 අතරින් රු. මිලියන 51 ක් නොමිලේ සැපයූ සේවා සම්බන්ධතා සඳහා ලැබිය යුතු අතර තවත් රු. මිලියන 51 ක් පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් වේ. මෙම ශේෂ දෙක සඳහා (රු. මිලියන 102 ක්) සම්පූර්ණ ප්‍රතිපාදන සලසා ඇත.<br><br>**අනෙකුත් ලැබිය යුතු මුදල්**<br>ඉතිරි රු. මිලියන 126 අතරින් රු. මිලියන 17 ක් සඳහා ප්‍රතිපාදන සලසා ඇත. ඉතිරිය විදේශ මිලදී ගැනීම් සඳහා වූ අත්තිකාරම් ගෙවීම් වන අතර එය 2025 මැයි මාසයේදී ගිණුම් සමඟ සැසඳීම් කර නිරවුල් කර ඇත, එබැවින්, ප්‍රතිපාදන අවශ්‍ය නොවීය.<br><br>**බෙදාහැරීමේ අංශය 04**<br>වර්ෂ 5 ට වැඩි අනෙකුත් ලැබිය යුතු ශේෂය රු. මිලියන 67.534 ක් වන අතර, අපි රු. මිලියන 11.79 ක ප්‍රතිපාදන සලසා ඇත. | |
| (ඕ) | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (ශ්‍රී .ලං.මූ.වා.ප්‍ර 10) 25(බී) වගන්තිය හා ප්‍රමිතිය යොදාගැනීමේ මාර්ගෝපදේශය හි බී 98(බී)(iii) වගන්තිය සහ ව්‍යාපාර සංයෝජන පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (ශ්‍රී .ලං.මූ.වා.ප්‍ර 03) 18 වන වගන්තියට පටහැනිව, එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් හි කොටස් 919,517,200 ක් වෙස්ට් කෝස්ට් පවර් ප්‍රයිවට් ලිමිටඩ් වෙත මාරු කිරීමෙන් පසු රඳවාගෙන ඇති 1,148,982,200 ක් වූ කොටස්වල වටිනාකම පාලනය අහිමි වූ දිනයේදී එහි සාධාරණ වටිනාකමට හඳුනාගෙන නොතිබූ අතර ඒ වෙනුවට සමාලෝචිත වර්ෂය අවසානයේදී මූල්‍ය ප්‍රකාශනවල එය පිරිවැයට පෙන්වා තිබුණි. | **මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, ලංවිම මූල්‍ය ප්‍රකාශන වෙනම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ශ්‍රී .ලං.ගි.ප්‍ර 27 ප්‍රමිතිය අනුකූලව වෙනම මූල්‍ය ප්‍රකාශන ලෙස සකස් කර ඇත. ශ්‍රී .ලං.ගි.ප්‍ර 27 ප්‍රමිතියේ 10 වන වගන්තියට අනුකූලව, පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වල ලංවිම හි ආයෝජන මැනීමට මණ්ඩලය විසින් පිරිවැය ආකෘතිය භාවිතා කිරීමට තෝරාගෙන ඇත. ඒ අනුව, එල්.ටී.එල් හෝල්ඩින් ලිමිටඩ් හි රඳවා ගත් ආයෝජනය ඓතිහාසික පිරිවැයට හඳුනාගෙන ඇති අතර එය අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට සම්පූර්ණයෙන්ම අනුකූල වේ.** | වෙනම මූල්‍ය ප්‍රකාශනවල පාලනය අහිමි වීමෙන් පසු කොටස් හිමිකම සාධාරණ වටිනාකමකින් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**කෙසේ වෙතත්, සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා එල්.ටී.එල් හි රඳවා ගත් කොටස්වල වටිනාකම ශ්‍රී .ලං.මූ.වා.ප්‍ර 10 ප්‍රමිතිය අනුව සාධාරණ වටිනාකමින් හඳුනාගෙන තිබුණි.**

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 සිට 2024 දක්වා කාලය තුළදී මණ්ඩලය විසින් වෙස්ට් කෝස්ට් පවර් ප්‍රයිවට් ලිමිටඩ් වෙත සපයන ලද රු. මිලියන 3,786 ක විදුලි ශක්තියේ පිරිවැය, සමාගමෙන් විදුලිය මිලදී ගැනීම වෙනුවෙන් මණ්ඩලයට ලද මාසික ඉන්වොයිස්වලින් අඩු කර තිබූ අතර ශුද්ධ ඉන්වොයිස් වටිනාකම මිලදී ගත් විදුලි ශක්තියේ පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි. 2022 වර්ෂයේ සිට, තථ්‍ය මිලදී ගැනීමේ වටිනාකම පිළිබිඹු කිරීම සඳහා එම මුදල නැවත මිලදී ගත් තාප විදුලිබල ගිණුමට හර කර තිබූ අතර සමාගමට විදුලිය සැපයීම වෙනුවෙන් විකුණුම් ආදායම හඳුනාගැනීමෙන් තොරව විවිධ ණයහිමියන්ට බැර කර තිබුණි. එබැවින්, 2024 ජනවාරි 01 වන දිනට රඳවා ගත් ඉපැයීම් සහ සමාලෝචිත වර්ෂය සඳහා ලාභය පිළිවෙලින් රු. මිලියන 2,849 කින් සහ රු. මිලියන 937 කින් අඩුවෙන් දක්වා තිබූ අතර විවිධ ණයහිමියන් රු. මිලියන 3,786 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වෙස්ට් කෝස්ට් පවර් සමාගම වෙත සපයන විදුලිය සඳහා නව ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක ලංවිම නියැලී සිටින අතර, ඒ සමඟම, ලංවිම විසින් එක් එක් මාසික ඉන්වොයිස්වලින් දැනටමත් අඩු කර ඇති වෙනස ගණනය කර පියවනු ඇත. | ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට සහ අනාගතයේදී නිවැරදි ගිණුම්කරණ ක්‍රමවේදයක් යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මණ්ඩලයේ අභ්‍යන්තර තක්සේරු වාර්තාව අනුව, වර්ෂ 3 කට පෙර බෙදාහැරීමේ අංශය 04 හි ආයතනික අංශයෙන් ඉවත් කරන ලද රු. මිලියන 495.18 ක් වූ ට්‍රාන්ස්ෆෝමර් සමාලෝචිත වර්ෂයේදී තොගවලට සහ අනෙකුත් ගෙවිය යුතු ගිණුම්වලට පිළිවෙලින් හර සහ බැර කර තිබුණි. කෙසේ වෙතත්, එම ට්‍රාන්ස්ෆෝමර්වල අදාළ පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් ගිණුම් පොත්වලින් ඉවත් කර නොතිබූ අතර, තොරතුරු නොමැතිකම හේතුවෙන් එමගින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | **ස්ථාවර වත්කම් ලේඛනයෙන් ට්‍රාන්ස්ෆෝමර්වල අදාළ පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් ඉවත් කිරීම සඳහා, ට්‍රාන්ස්ෆෝමර් අංකය සහ SIN අංකය මත පදනම්ව, එක් එක් ට්‍රාන්ස්ෆෝමරය නිවැරදිව හඳුනා ගැනීම අවශ්‍ය වේ. නිසි ලෙස හඳුනා ගැනීමට සහ ලේඛනයෙන් අදාළ වත්කම් ඉවත් කිරීමට හැකි වන පරිදි මෙම තොරතුරු ලබා දෙන ලෙස අදාළ ඒකක වෙත ඉල්ලීම් කර ඇත.** | ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වර්ෂය තුළදී දකුණු පළාත (i) හා (ii) සහ බස්නාහිර පළාත දකුණ (i) හි ට්‍රාන්ස්ෆෝමර්වල චලනයන් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව, රු. මිලියන 91.79 ක් වූ ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් 112 ක ධාරණ වටිනාකම ගිණුම් පොත්වල ගැලපීම් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, දකුණු පළාත (i) සහ (ii) හි සවිකර කරන ලද ධාරණ වටිනාකම රු. මිලියන 217.85 ක් වූ ට්‍රාන්ස්ෆෝමර් 69 ක් ස්ථාවර වත්කම් ලේඛනවල සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය අවසානයේදී ට්‍රාන්ස්ෆෝමර්වල ධාරණ වටිනාකම රු. මිලියන 126.05 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අපහරණය කරන ලද ට්‍රාන්ස්ෆෝමර් ලේඛනයෙන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඇත. කෙසේ වෙතත්, නිශ්චිත සත්‍යාපනය සඳහා වන අවශ්‍යතාවය නිසා මෙම ක්‍රියාවලියට කාලය අවශ්‍ය වේ. ඒ අනුව, මෙම කාරණය අනාගතයේදී නිවැරදි කරනු ඇත. | ට්රාන්ස්ෆෝමර් එකතු කිරීම් සහ අපහරණය කිරීම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය සහ මූල්‍ය ප්‍රකාශන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මෙට්‍රික් ටොන් 14,964.71 ක් වූ ඩෙෆ් ගල් අඟුරු (deaf coal) සෘණ ශේෂය ඇතුළත් රු. මිලියන 1,778.6 කට අගය කරන ලද මෙට්‍රික් ටොන් 24,251 ක තාප ගල් අඟුරු තොග හිඟය ගැලපීමෙන් පසු 2023 සැප්තැම්බර් 15 වන දිනට ගල් අඟුරු අංගනයේ තාප ගල් අඟුරු තොගයේ පොත් ශේෂය මෙට්‍රික් ටොන් 12,206.68 ක් විය. කෙසේ වෙතත්, මෙම නිශ්චිත දිනයේදී, බංකරවල ඉතිරිව තිබූ ගල් අඟුරු සහ අලුතින් ගොඩබාන ලද ගල් අඟුරු ප්‍රමාණය හේතුවෙන් තාප ගල් අඟුරු තොග ශේෂය මෙට්‍රික් ටොන් 27,171.39 ක් විය. එබැවින්, 2023 දෙසැම්බර් 31 වන දිනට රු. මිලියන 924.3 කට අගය කරන ලද මෙට්‍රික් ටොන් 14,964.71 කින් තාප ගල් අඟුරු තොගය අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට තාප ගල් අඟුරු තොගය එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි. | 2023 සැප්තැම්බර් 15 වන දිනට තාප ගල් අඟුරු තොගය මෙට්‍රික් ටොන් 12,206 දක්වා පහත වැටී තිබූ අතර, ප්‍රධාන වශයෙන් මෙට්‍රික් ටොන් 14,964.71 ක ඩෙෆ් ගල් අඟුරු ප්‍රමාණය නැවත පිරවීම හේතුවෙන් මෙට්‍රික් ටොන් 24,151 ක ගණනය කරන ලද ගල් අඟුරු තොග හිඟයක් ඇති විය. 2022/2023 ගල් අඟුරු වාරය තුළ, දැඩි මූල්‍ය සීමාවන් හේතුවෙන් ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සැලකිය යුතු ප්‍රමාදයන් සහ අභියෝගවලට මුහුණ දෙන ලදී.<br>එහි ප්‍රතිඵලයක් ලෙස ගල් අඟුරු තොගය ශුන්‍ය මට්ටමකට ළඟා විය. ඊළඟ නැව් බඩු තොග පැමිණෙන තෙක් අඛණ්ඩව බලාගාරයේ මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා, බුල්ඩෝසර් භාවිතා කරමින් අංගනය සූරා දැමීමෙන් අංගනයේ තිබූ ගල් අඟුරු ලබා ගන්නා ලදී.<br>විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ බලාගාරයේ නිලධාරීන් විසින් ගල් අඟුරු තොග සත්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධයෙන් විගණක විසින් මතු කරන ලද ගැටළු විසඳීම සඳහා 2025 අගෝස්තු 29 වන දින ලක්විජය බලාගාරයේදී රැස්වීමක් පවත්වන ලදී. සාකච්ඡා අතරතුර, තොග සත්‍යාපන ක්‍රියාවලියට | ගල් අඟුරු තොග සත්‍යාපනයේදී ඩෙෆ් ගල් අඟුරු සලකා බැලීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර භෞතික තොග ගණනය කිරීම නිවැරදි හා සම්පූර්ණ විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අදාළ ගැටළු හොඳින් සමාලෝචනය කරන ලද අතර, තීරණ කිහිපයක් ගන්නා ලදී. මෙම තීරණවලට අනුකූලව, හඳුනාගත් ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ඇත. | |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ශේෂය රු. මිලියන 218,186 ක් විය. ඒ අතරින්, වර්ෂ 3 කට වැඩි කාලයක සිට කෙරීගෙන යන වැඩ ලෙස රු. මිලියන 89,788.64 ක මුදලක් පැවතුණි. තවද, නියදි විගණන පරීක්ෂාවකදී, 2024 දෙසැම්බර් 31 වන දිනට සම්පූර්ණයෙන් නිම කරන ලද බෙදාහැරීමේ අංශය 02 හි රු. මිලියන 176.9 ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් 295 ක්, බෙදාහැරීමේ අංශය 04 හි රු. මිලියන 118.1 ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් 45 ක්, බෙදාහැරීමේ අංශය 04 හි ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම සඳහා දරන ලද රු. මිලියන 119.68 ක් වූ පිරිවැය, වැඩපොළ, සහායක සේවා අංශයට අදාළ රු. මිලියන 17.71 ක පිරිවැයකින් යුත් සම්පූර්ණ කරන ලද ප්‍රාග්ධන නොවන කාර්යයන් හතක් සහ සම්ප්‍රේෂණ අංශයේ රු. මිලියන 101.4 ක් වූ ප්‍රාග්ධන කාර්යයන්, ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ලෙස පැවතුන බවට හෙළිදරව් විය. තවද, අමාත්‍යාංශ අරමුදල් භාවිතා කරමින් කරන ලද කාර්යයන් ලෙස බෙදාහැරීමේ අංශයේ 04 හි වර්ෂ 5 කට වැඩි කාලයක සිට රු. මිලියන 40.15 ක මුදලක් පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | **බෙදාහැරීමේ අංශය 01**<br>2025 ජූලි දක්වා ප්‍රාග්ධන කාර්යයන් 20,796 ක් රු. මිලියන 5,453 ක වටිනාකමකට මාරු කර ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 2**<br>එවැනි ශේෂයන් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රතිකාවක් ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලද පසු ගිණුම්වලින් එවැනි ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 4**<br>ඉතිරි සම්පූර්ණ කරන ලද කාර්යයන් නියමිත වේලාවට ප්‍රාග්ධනිත කිරීමට අපි විසින් කටයුතු කරනු ඇත.<br><br>**වත්කම් කළමනාකරණය**<br>2025 වර්ෂය තුළදී ප්‍රධාන ඉංජිනේරු (AC & Ref) සහ ප්‍රධාන ඉංජිනේරු (විදුලි බලාගාර) වෙතින් සම්පූර්ණ කිරීමේ සහතික සහ අවශ්‍ය උපදෙස් ලැබී ඇති බැවින්, 2025 මූල්‍ය ප්‍රකාශනවල ආදායමට ගැලපීම් සිදු කරනු ඇත. | කෙරීගෙන යන වැඩ ශේෂවල ඉතිරිව ඇති සම්පූර්ණ කරන ලද කාර්යයන් ප්‍රාග්ධනිත කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඊ) | පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (අදියර ii) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන හයක් 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුවද ප්‍රාග්ධනිත ක කර නොතිබුණු අතර කෙරීගෙන යන වැඩ ලෙස පෙන්වා තිබුණි. තවද, මෙම වාහන හය සහ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ | පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියට (අදියර II) අදාළව රු. මිලියන 124.30 ක් වටිනා වාහන හය පිළිබඳ නිරීක්ෂණය සම්බන්ධයෙන්, වටිනාකම ව්‍යාපෘතියඅංශයේ ගිණුම්වල සටහන් වී ඇති බවත්, තවමත් ප්‍රාග්ධනිත ක කර හෝ ජනන අංශයට මාරු කර නොමැති බවත් තහවුරු වේ.<br>එම ව්‍යාපෘතියේ අදියර I යටතේ වන | මෙම වාහන පවරාගෙන ඒවා රඳවා තබා ගැනීමට සහ ඒවා ප්‍රාග්ධනිත ක කිරීමට වහාම කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (අදියර i) තවත් වාහන 11 ක්, මෙම වාහනවල පිරිවැය ඒ වන විටත් අදාළ ව්‍යාපෘතිවල පිරිවැයට ඇතුළත් කර තිබියදීත් මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන 11 සම්බන්ධයෙන්, එම වාහන ආපසු ලබා ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කර ඇත. අනුගමනය කළ යුතු අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව ගරු නීතිපතිවරයාගෙන් වැඩිදුර උපදෙස් ලංවිම බලාපොරොත්තුවෙන් සිටී.<br>ලංවිම බහුවිධ ලිපි හුවමාරුව හරහා කොන්ත්‍රාත්කරු සමඟ නිරන්තරව පසු විපරම් කර ඇති අතර වර්තමානයේදී නඩු පැවරීමට කටයුතු කරමින් සිටී. | |
| (උ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට බෙදාහැරීමේ අංශවල මාර්ගස්ථ තොග ශේෂය රු. මිලියන 2,142.10 ක් විය. ඒ අතරින්, සැපයුම්කරුවන් සතුව තිබූ රු. මිලියන 431.55 ක් වටිනා තොගය වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුන අතර, බෙදාහැරීමේ අංශය 01 හි රු. මිලියන 35.83 ක් වටිනා තොගය වර්ෂ 5 කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුණි. ඊට අමතරව, 2021 සැප්තැම්බර් 23 දිනැති අංක 2021/GM/40/DCC දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගමට නිකුත් කරන ලද භාවිතා කළ නොහැකි රු. මිලියන 407.81 ක ඇලුමිනියම් තොගය ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | **බෙදාහැරීමේ අංශය 01**<br>රු. මිලියන 1.34 ක් හඳුනාගෙන ඇති අතර 2025 මැයි මාසයේ ගිණුම්වලින් නිරවුල් කරනු ඇත. ආධාරක ලියකියවිලි සොයා ගත් පසු ඉතිරි ශේෂයන් නිරවුල් කරනු ඇත.<br><br>තවද, රු. මිලියන 46.78 ක ශේෂය, 2021/GM/40/DCC චක්‍රලේඛය යටතේ ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට නිකුත් කරන ලද භාවිතා කළ නොහැකි ඇලුමිනියම් තොගයට අදාළ වන අතර එමඟින් ඇලුමිනියම් re-draw rods සඳහා ඉවතලන ඇලුමිනියම් හුවමාරු කරයි. මේවා ශ්‍රී ලංකා එනර්ජීස් සතු තොගය සඳහා වන ලෙජර් ගිණුම් අංක ඒ4710 යටතේ සටහන් කර ඇත.<br>**බෙදාහැරීමේ අංශය 02**<br>රු. මිලියන 232.98 ක මාර්ගස්ථ තොග ශේෂය, ඇලුමිනියම් rods /කේබල් බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා එනර්ජීස්, ACL කේබල් සහ සියෙරා කේබල් වෙත භාර දෙන ලද ඇලුමිනියම් තොගය නියෝජනය කරයි. වැරදි සම්මත මිලක් හේතුවෙන් රු. මිලියන 0.84 ක දේශීය මිලදී ගැනීමේ විෂමතාවයක් ඇති වූ අතර, එය 2025 මැයි මාසයේ ගිණුම්වල නිවැරදි කරනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 03**<br>"සැපයුම්කරුවන් සතුව ඇති තොගයේ" මුළු ශේෂය අතරින් රු. මිලියන 62 ක් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට අයත් වන අතර එය rods බවට පරිවර්තනය කර බෙදාහැරීමේ අංශය 03 වෙත බෙදා හැරීමට නියමිත ඉවතලන | දිගු කලක් තිස්සේ පවතින මාර්ගස්ථ තොග ශේෂයන් විමර්ශනය කර ඒවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.<br><br>ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගමට නිකුත් කරන ලද භාවිතා කළ නොහැකි ඇලුමිනියම් තොග, පවතින චක්‍රලේඛයේ විධිවිධාන අනුව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඇලුමිනියම් නියෝජනය කරයි.<br>**බෙදාහැරීමේ අංශය 04**<br>ශ්‍රී ලංකා එනර්ජීස් වෙත මාරු කරන ලද තොග, නිමි භාණ්ඩ ලැබෙන තුරු ලැබිය යුතු මුදල් ලෙස සටහන් නොකරයි.<br>දකුණු පළාත 2 හි ගිණුම්වල පවතින රු. මිලියන 1.7 ක මාර්ගස්ථ තොග ශේෂය 2025 මැයි මාසයේ ගිණුම්වල නිරවුල් කරනු ඇත. | |
| (ඌ) | බෙදාහැරීමේ අංශය 01 හි කලින් කරන ලද ගෙවීම්වල වයස් විශ්ලේෂණය තුළ රු. මිලියන 162.94 ක අසාමාන්‍ය බැර ශේෂයක් සහ ජනන මූලස්ථානයේ වෙළඳ ගෙවිය යුතු මුදල්වල රු. මිලියන 7.88 ක අසාමාන්‍ය හර ශේෂයක් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | **බෙදාහැරීමේ අංශය 01**<br>කෙසේ වෙතත්, 2025 අප්‍රේල් මාසයේ මූල්‍ය වාර්තාවල මෙම විචලනයන් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කරන ලද අතර 2025 මැයි මාසයේ ගිණුම්වල ද රු. මිලියන 75.25 ක තවදුරටත් නිවැරදි කිරීම් සිදු කරන ලදි.<br>**ජනන අංශය**<br>මෙම හර ශේෂය, සෙලාන් බැංකුවෙන් ලබා ගන්නා ලද කාලීන ණය සඳහා වන ණය පොලිය සඳහා පාරිභෝගික එකතු කිරීම්වලින් අඩු කරන ලද මුදලක් පියවීමට අදාළව බෙදාහැරීමේ අංශය 01 වෙත කරන ලද වැඩිපුර ගෙවීමක් නියෝජනය කරයි. 2025 ජනවාරි මාසයේදී අධික ගෙවීම සම්පූර්ණයෙන්ම නිරවුල් කරන ලදි. | මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමට පෙර වත්කම් සහ වගකීම් ගිණුම්වල අසාමාන්‍ය බැර සහ හර ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (එ) | **2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ලක්විජය බලාගාරය ව්‍යාප්ති ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘතියකළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක වියදමක් දැරීමෙන් අනතුරුව, 2021 සැප්තැම්බර් 13 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත පදනම්ව 2021 ඔක්තෝබර් 26 දින ව්‍යාපෘතිය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. ඒ අනුව, නිරවුල් කිරීමෙන් තොරව 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 167.62 ක මුදල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ පෙන්වා තිබුණි.** | අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) විසින් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිකාවක් ඉදිරිපත් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය තවමත් ලැබීමට නියමිතය. | මූල්‍ය ප්‍රකාශනවල ඉතිරිව ඇති ශේෂය කපා හැරීමට හෝ ප්‍රතිපාදන සැලසීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | **මණ්ඩලයේ ජනන අංශයට අදාළ රු. මිලියන 36,103.35 ක් වටිනා වේලි වැඩ සහ උමං මාර්ග වැඩ මහවැලි සංකීර්ණයේ දේපල පිරියත හා උපකරණවල සිවිල් වැඩ යටතේ පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, එම මුදලේ නිරවද්‍යතාවය සහ අදාළ වත්කම් සම්බන්ධව මණ්ඩලයට ඇති හිමිකම පිළිබඳව විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.** | මෙම සාකච්ඡාවලින් පසුව, අන්‍යෝන්‍ය එකඟතාවයකට එළඹුණු අතර, 2025 අප්‍රේල් 22 වන දින ලංවිම සහ MASL යන දෙපාර්ශවයම ඒකාබද්ධ වාර්තාවක් විධිමත් ලෙස අත්සන් කරන ලදි.<br><br>මෙම නිගමනයට අනුව, MASL විසින් පවත්වාගෙන යනු ලබන වත්කම් ලංවිම ගිණුම්වලින් ඉවත් කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිකාවක් අනුමැතිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.<br>ලංවිම හි රජයේ ස්කන්ධ ආයෝජනයට බලපානු ඇති බැවින් මහවැලි සංකීර්ණයට අදාළ වේලි වත්කම් ලංවිම ගිණුම් පොත්වලින් ඉවත් කිරීම සඳහා කැමැත්ත ඉල්ලා සාමාන්‍යාධිකාරි විසින් අත්සන් කරන ලද ලිපියක් 2025 ජුනි 16 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත.<br>මෙම කරුණ සාකච්ඡා කිරීම සඳහා 2025 අගෝස්තු 28 වන දින භාණ්ඩාගාරයේදී රැස්වීමක් පවත්වන ලද අතර, මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දෙන ලදි. | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වේලි වැඩවල වටිනාකමෙහි නිරවද්‍යතාවය සහ අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | **විදුලිබල පද්ධති විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ කලවාන, මීගමුව සහ පැලියගොඩ යන ප්‍රදේශවල කොටුමා උපපොළවල් ඉදිකිරීම සඳහා 2021 සහ 2022 වර්ෂවලදී රු. මිලියන 171 ක වියදමින් මිලදී ගත් ඉඩම්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.** | මෙය 2025 නොවැම්බර් මාසික ගිණුම්වල නිවැරදි කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල සියලුම ඉඩම් වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | **චීන සංවර්ධන බැංකුවෙන් ලද ශේෂ තහවුරු කිරීමට අනුව, බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතියට අදාළව හිඟ ණය ශේෂය සඳහා එ.ජ.ඩො මිලියන 2.6 ක පැහැර හැරීමේ පොලියක් අය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.** | මෙම ණය මුදල ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනට ඇතුළත් කර ඇත. ණය සාකච්ඡා තවමත් සිදුකරමින් පවතින බැවින් ගෙවීම් නියමයන් තවමත් එකඟ වී අවසන් කර නොමැත. එබැවින්, ලංවිම සහ ICBC විසින් නියමයන් සහ කොන්දේසි පිළිබඳ එකඟතාවයකට එළඹ වන තුරු හිඟ ණය ප්‍රාග්ධනය කොටස පමණක් ගිණුම්ගත කර ඇත. | ලද තහවුරු කිරීම අනුව අවම වශයෙන් ණය දෙන්නන් විසින් අය කරනු ලබන පැහැර හැරීමේ පොලිය සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | **2024 සැප්තැම්බර් 12 දිනැති මූල්‍ය කළමනාකරු චක්‍රලේඛ අංක 644 හි නියමයන්ට අනුව, සෙමින් වලනය වන සහ වලනය නොවන තොග සඳහා වත්කම් කළමනාකරණ අංශය, බෙදාහැරීමේ අංශය 1 හා 4 සහ බෙදාහැරීමේ අංශය 2 හා 3 ට අදාළව රු. මිලියන 14.32 ක්, රු. මිලියන 7.96 ක් සහ රු. මිලියන 177.15 ක් පිළිවෙලින් ප්‍රතිපාදන සිදු නොකිරීම, වැඩියෙන් ප්‍රතිපාදන කිරීම සහ අඩුවෙන් ප්‍රතිපාදන කිරීම හේතුවෙන් වර්ෂය සඳහා ලාභය රු. මිලියන 183.51 කින් වැඩියෙන් දක්වා තිබුණි.** | **වත්කම් කළමනාකරණ අංශය**<br>**මෙය 2025 ගිණුම්වල නිවැරදි කරනු ඇත.**<br>**බෙදාහැරීමේ අංශය 01**<br>තොග ප්‍රතිපාදන ගණනය කිරීමේ ක්‍රියාවලියේදී ඇති වූ ගැටළු නිසා මෙය සිදු වී ඇත. ඉහත සඳහන් ශේෂයන් වහාම නිවැරදි කරන ලෙස සෑම පළාතකම ගණකාධිකාරීවරුන්ට (වියදම්) උපදෙස් දී ඇත.<br>**බෙදාහැරීමේ අංශය 02**<br>ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් රු. 175,704,664.50 ක වෙනස පැන නැගී ඇති අතර එය 2025 ජුනි මාසයේ මාසික ගිණුම්වල නිවැරදි කරනු ඇත.<br>**බෙදාහැරීමේ අංශය 03**<br>සබරගමුව පළාතට අදාළව, හානියට පත් තොගයේ වටිනාකම පිළිබඳව පරීක්ෂණයක් සිදුකරමින් පවතින බැවින් ප්‍රතිපාදන සලසා නොමැත.<br>**බෙදාහැරීමේ අංශය 04**<br>**ප්‍රතිපාදනය නිවැරදි කිරීම සඳහා වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ඇත.** | සෙමින් වලනය වන සහ වලනය නොවන තොග සඳහා කරන ලද ප්‍රතිපාදනවල නිරවද්‍යතාවය සහතික කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ශේෂය (රු. මිලියන 176.49 ක්) සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්තාවල අනුරූප ලැබිය යුතු ශේෂය (රු. මිලියන 838.22 ක්) අතර රු. මිලියන 661.73 ක වෙනසක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම වෙනස විසඳා නොතිබුණි. | 2024.12.31 දිනට බලාගාර අනුව සැසඳුම් ප්‍රකාශනය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තාප සංකීර්ණය) ශාඛාවෙන් සකස් කර ඇත. | නොවිසඳුණු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට හිඟව පැවතුණු අතර ඒ අතරින් රු. මිලියන 185.41 ක මුදලක් විමර්ශනය කර අදාළ ලේජර ගිණුම්වලට ගැලපීමෙන් තොරව 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා බෙදාහැරීමේ අංශවල ණයගැති පාලන ගිණුම්, වෙනත් වගකීම් ගිණුම් ආදිය වෙත මාරු කර තිබුණි. | මුල් වටිනාකම රු. මිලියන 423.76 ක් වූ ණයගැති ශේෂයන් අතරින් රු. මිලියන 185.41 ක මුදලක්, 2018 අගෝස්තු 17 දිනැති AFM(DD1)/Acct(A&MI)/ආදායම් ණය ගැතියන් /2018 දරන ලිපිය මත පදනම්ව ඩීඩී03 හි අතිරේක මූල්‍ය කළමනකරුගේ ශාඛාවේම බිල්පත් සහ ලෙජර පද්ධතිය සැසඳීමෙන් පසුව ලෙජර් ශේෂය සමඟ එම ශාඛාව වෙත මාරු කර ඇත. 2002 දී විමධ්‍යගත කිරීමේ | බලපෑමට ලක් වූ ගිණුම් නිවැරදිව පරීක්ෂා කර හඳුනා නොගත් ණයගැති ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ක්‍රියාවලියේදී මෙම මුදල මාරු කර ඇත. ඉහත දක්වා ඇති කරුණුවලට වැඩිමනක් වශයෙන්, ශේෂය මාරු කිරීම සඳහා කිසියම් ශේෂයක් තම අංශවලට අයත් දැයි පරීක්ෂා කිරීම සඳහා සියලුම ප්‍රාදේශීය අතිරේක මූල්‍ය කළමනකරුවන් වෙත ද දැනුම් දෙනු ලබයි. | |
| (ඇ) | 2024 දෙසැම්බර් 31 දිනට ණයගැති එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 415.19 ක හර ශේෂයක් සහ රු. මිලියන 1,999.29 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේ වෙතත්, නිරවුල් නොවූ රු. මිලියන 273.41 ක හර ශේෂයක් සහ රු. මිලියන 1,560 ක බැර ශේෂයක් සැසඳීම විගණනය සඳහා ලැබී නොතිබුණි. එබැවින්, එකතු කිරීමේ පාලන ගිණුමේ ශේෂවල නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, නිරවුල් කිරීමෙන් තොරව මූලස්ථානයේ රු. මිලියන 12.75 ක් වූ හඳුනා නොගත් ආරම්භක හර ශේෂය වසර 5 කට වැඩි කාලයක සිට සහ බස්නාහිර පළාත දකුණ (ii), බෙදාහරීමේ අංශය 01 හි ආයතනික අංශය සහ සබරගමුව පළාතේ රු. මිලියන 103.85 ක් වූ ආරම්භක බැර ශේෂය වසර 01 කට වැඩි කාලයක සිට එම ගිණුමේ පැවතුණි. ඊට අමතරව, සබරගමුව පළාතේ රු. මිලියන 6.35 ක සහ දකුණු පළාත 1 හි රු. මිලියන 131.64 ක හඳුනා නොගත් ආරම්භක හර ශේෂයක් පිළිවෙලින් වර්ෂ 3 ක සහ වර්ෂ 01 ක සිට නිරවුල් නොවී පැවතුණි. | මාසික සැසඳුම්, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්, තොරතුරු තාක්ෂණ පද්ධති යාවත්කාලීන කිරීම් සහ ඓතිහාසික විෂමතා ඉවත් කිරීම ඇතුළුව සියලුම එකතු කිරීමේ පාලන ගිණුම් සැසඳීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. හිඟ වෙනස්කම් ක්‍රමානුකූලව ආමන්ත්‍රණය කරමින් ඇත. | ණයගැතියන්ගේ එකතු කිරීමේ පාලන ගිණුමේ නොපියවූ ශේෂයන් සඳහා සැසඳුම් සකස් කිරීමට සහ එකතු කිරීමේ පාලන ගිණුමේ දිගුකාලීනව හඳුනා නොගත් හිඟ ශේෂයන් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මණ්ඩලය සහ වෙස්ට් කෝස්ට් පවර් ප්‍රයිවට් ලිමිටඩ් අතර අත්සන් කරන ලද විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ (PPA) 09 වන උපලේඛනයේ ඇමුණුම ඒ හි අංක 02 වගන්තියට අනුව, බලාගාරයේ (පහසුකම) තථ්‍ය කාර්ය සාධනය මත පදනම්ව මණ්ඩලයට කිසියම් වාසිදායක ගැලපීමක් ලබා ගැනීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා "එකඟ වූ පරාමිතීන් සහ අගයන්" පිළිබඳ ඒ:2 වගුවේ ඒකාබද්ධ චක්‍රීය අගයන් විශ්ලේෂණය කිරීම සඳහා පාර්ශවකරුවන් | යුගදනවි බලාගාරයේ ඒකාබද්ධ චක්‍රීය මෙහෙයුම් ආරම්භයේ සිට එකඟ වූ පරාමිති ක්‍රියාත්මක කිරීමට නම්, ප්‍රධාන ඉන්වොයිස් අගයන් මෙන්ම එයට ගෙවිය යුතු පොලිය 2010 මැයි මාසයේ සිට ගණනය කළ යුතුය.<br>ඉන්වොයිස් ගණනය කිරීමේ කාලය දීර්ඝ වන අතර 2010 මැයි මාසයේ සිට ලංවිම විසින් WCPL වෙත කරන ලද සියලුම ගෙවීම් සත්‍යාපනය කිරීමට අවශ්‍ය බැවින්, ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට සැලකිය යුතු කාලයක් ගතවනු | වෙනස සැසඳීමට සහ ඒවා පියවීමට ඉන්වොයිස් ගණනය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විසින් වාරයේ පළමු වර්ෂය අවසානයේ රැස්වීමට එකඟ විය. කෙසේ වෙතත්, සමාගමේ එකඟතාවයකින් තොරව 2019 පෙබරවාරි 15 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මාසික ඉන්වොයිසි සහතික කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි අතරමැදි විසඳුමක් ලෙස සමහර ඒකාබද්ධ චක්‍රීය පරාමිතීන් හි අගයන් වෙනස් කිරීමට මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, සමාගම විසින් PPA හි නිශ්චිතව දක්වා ඇති පරාමිතීන් හි අගයන් මත පදනම්ව ඔවුන්ගේ මාසික ඉන්වොයිසි අඛණ්ඩව ඉදිරිපත් කර ඇතත්, 2019 පෙබරවාරි සිට සමාගම විසින් ඉදිරිපත් කරන ලද මාසික ඉන්වොයිසි, පරාමිතීන් සඳහා අඩු කළ අගයන් භාවිතා කරමින් මණ්ඩලය විසින් සහතික කර තිබුණි. මෙම ආරවුල හේතුවෙන්, මණ්ඩලයේ වාර්තාවලට අනුව 2024 දෙසැම්බර් 31 වන දිනට සමාගමට ගෙවිය යුතු ශේෂය (රු. මිලියන 7,452 ක්) සහ සමාගමේ වාර්තාවලට අනුව අනුරූප ශේෂය (රු. මිලියන 30,323 ක්) අතර රු. මිලියන 22,871 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වෙනස සැසඳීමට සහ ඒවා පියවීමට කටයුතු කර නොතිබුණි. | ඇත. එම ක්‍රියාවලිය සම්පූර්ණ කර දෙපාර්ශවයම එකඟ වූ පසු, අවසාන ගණනය කිරීම් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත. | |

**1.5.4 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු. මිලියන 6,472.1 ක් වූ නොසැසඳූ සම්බන්ධිත පාර්ශව හර ශේෂ සහ රු. මිලියන 1,377.9 ක් වූ බැර ශේෂ නිරවුල් කිරීමෙන් තොරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් වෙනත් ණය ගැතියන් සහ වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ ගිණුම්ගත කර තිබුණි. | අදාළ වන විට, ලංවිම පොත්වල වාර්තා නොකළ ගනුදෙනු වාර්තා කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලංවිම හි අදාළ ඒකක ප්‍රධානීන්ට ද දැනුම් දී ඇත. සම්බන්ධිත පාර්ශව ශේෂයන්හි පවතින වෙනස්කම් සැසඳීමට සහ අවම කිරීමට අඛණ්ඩ පසු විපරම් ක්‍රියාමාර්ග සිදු කරයි. | නොසැසඳූ සම්බන්ධිත පාර්ශව ශේෂයන් නිරවුල් කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 24) 18 වන වගන්තියට පටහැනිව, ආශ්‍රිත සමාගමක් වන එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සම්බන්ධයෙන්, බැඳීම් සහ ඒවායේ නියමයන් හා කොන්දේසි ඇතුළත් හිඟ ශේෂයන්, ලබා දී ඇති හෝ ලද ඕනෑම | ලංවිම විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් අවශ්‍ය හෙළිදරව් කිරීම් උපුටා ගෙන 2024 සමූහ ගිණුම්වලට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. | ආශ්‍රිත සමාගමකට අදාළව අවම අවශ්‍යතා හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී.ලං.ගි.ප්‍ර 24 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇපකරයක විස්තර ආදිය වැනි අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඈ) | ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජන පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය (ශ්‍රී.ලං.ගි.ප්‍ර 28) හි 10 වන වගන්තියට අනුව, ආශ්‍රිත සමාගමක හෝ බද්ධ ව්‍යාපාරයක ආයෝජනය පිරිවැයට මූලිකව හඳුනා ගනු ලබයි. ධාරණ අගය හි වැඩිවීම හෝ අඩුවීම මත අත්පත් කර ගැනීමේ දිනයෙන් පසු ආයෝජිත සමාගමේ ලාභයෙන් හෝ අලාභයෙන් ආයෝජක සමාගමේ කොටස හඳුනා ගැනීම සිදු කරනු ලබන අතර ආයෝජිත සමාගමේ ලාභයෙන් හෝ අලාභයෙන් ආයෝජක සමාගමේ කොටස ආයෝජක සමාගමේ ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලබයි. කෙසේ වෙතත්, ආයෝජිත සමාගමේ පශ්චාත් මෙහෙයුම් ලාභය වැරදි ලෙස ගණනය කිරීම හේතුවෙන් ආශ්‍රිත සමාගමේ ආයෝජනයේ ධාරණ වටිනාකම සහ සමූහයේ ලාභය රු. මිලියන 427.35 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පශ්චාත් අත්පත් කර ගැනීමේ ලාභය ගණනය කිරීමේදී වැරැද්දක් සිදුවී ඇති බව නිරීක්ෂණ වී ඇත. ඊළඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ඇත. | ආශ්‍රිත ආයෝජනයේ පශ්චාත් මෙහෙයුම් ලාභය හඳුනාගැනීමේදී ඇති වූ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| | **සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම** | | |
| (ඇ) | මූල්‍ය සාධන පත්‍ර පිළිබඳ ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09 හි 5.5.15 (ඒ) වගන්තිය අනුව, ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 15 හි විෂය පථය තුළ ඇති ගනුදෙනුවලින් ප්‍රතිඵලයක් ලෙස ඇතිවන වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් හෝ ගිවිසුම් වත්කම් සඳහා, සමාගම විසින් සෑම විටම පාඩු දීමනාව ජීවිත කාලය පුරා අපේක්ෂිත ණය පාඩුවලට සමාන මුදලකින් මැනිය යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් රු. මිලියන 28,248.08 ක වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන ගිණුම්ගත කර නොතිබුණු අතර ඒ අතරින් රු. මිලයන 1,497.4 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අයකර ගැනීමෙන් තොරව පැවතුණි. | මෙම ශේෂයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ලංවීම වෙතින් ලැබිය යුතු වේ. මෙම ශේෂයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් පවත්වන ලද අතර රැස්වීම් සටහන්වලට අනුව සමාගම විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | ණයගැති හානිකරණය සඳහා ප්‍රතිපාදන සැලසීමේදී ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඉ) | ගල් අඟුරු සම්බන්ධයෙන් සමාගමේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය වනුයේ ජැටිය දක්වා භාර දීමේදී දරන ලද සියලු | ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් පැන නගින අයභාරය පිළිබඳ ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 15 හි 31-38 වගන්තිවලට | සෑම ප්‍රසම්පාදනයකම ආදායම් හඳුනාගැනීමේ අනුකූලතාව පවත්වා |

| | | | |
|---|---|---|---|
| | පිරිවැය ඇතුළත් කරමින් ඉන්වොයිසිකරණ අරමුණු සඳහා මිල නියම කිරීමයි. ජැටියට ගල් අඟුරු භාර දීමෙන් පසු භාණ්ඩ හුවමාරුව ගැනුම්කරුට ලැබෙන බවත් එය ගැනුම්කරුට ඉන්වොයිස් කරන බවත් සලකනු ලබයි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට ජැටිය වෙත ලද රු. මිලියන 656.9 ක් වටිනා ගල් අඟුරු මෙට්‍රික් ටොන් 15,795 ක් ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී වර්ෂය සඳහා ලාභය සහ වෙළඳ ලැබිය යුතු මුදල් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අනුකූලව, භාණ්ඩවල පාලනය ගනුදෙනුකරු වෙත පැවරීමෙන් ආයතනය කාර්ය සාධන වගකීමක් සපුරාලන විට (හෝ ලෙස) ආදායම හඳුනා ගනී. මෙම සිද්ධියේ පාලනය මාරු වීම 2025 ජනවාරි 04 වන දින ගොඩ බෑම සම්පූර්ණ කිරීමෙන් පසු සිදු වූ බැවින්, ආදායම පසුකාලීන ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ සුදුසු පරිදි හඳුනා ගන්නා ලදි.<br><br>එබැවින්, 2024 දෙසැම්බර් 31 වන දිනට ආදායම ලෙස රු. මිලියන 656.9 ක් හඳුනා නොගැනීම ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 15 සහ ලංවිම සමඟ එකඟ වූ ගිවිසුම් නියමයන්ට අනුකූල වන අතර, මූල්‍ය ප්‍රකාශනවල ගනුදෙනුව නිවැරදිව හා විශ්වාසනීයව නියෝජනය කිරීම සහතික කරයි. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2025 අප්‍රේල් 09 වන දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් විස්තරවලට අනුව, රු. මිලියන 1,977.5 ක වැට් බදු දඩ මුදල ඇතුළුව කාර්තු පහක් සඳහා ගෙවිය යුතු වැට් බදු මුදල රු. මිලියන 5,364.27 ක් වසර තුනක සිට පියවීමෙන් තොරව පැවතුණි. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන හෝ හෙළිදරව් කර නොතිබුණි. | පුළුල් අභ්‍යන්තර සමාලෝචනයකින් පසුව, වැට් බදු වාර්තාවල වාර්තා කර ඇති විකුණුම් සහ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ආදායම අතර විෂමතාවන්ට මූලික හේතු අපි දැන් හඳුනාගෙන ඇත. නිවැරදි කරන ලද සංඛ්‍යා පිළිබිඹු කිරීම සහ ගිණුම්කරණ වාර්තා සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා බලපෑමට ලක් වූ වැට් බදු වාර්තා ඒ අනුව සංශෝධනය කිරීමට සමාගම අදහස් කරයි.<br>මීට අමතරව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2024/06/20 දිනැති නව තක්සේරුවක් නිකුත් කර ඇති අතර, එමඟින් 2019 පළමු කාර්තුව අවසන් වන දිනට රු. 26,306,145 ක අතිරික්ත යෙදවුම් වැට් බද්දක් හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් සහ අනෙකුත් හිඟ බදු කරුණු සම්බන්ධයෙන් අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාකාරීව සාකච්ඡා කරමින් සිටී. සංශෝධිත වැට් බදු ඉදිරිපත් කිරීම් පිළිගැනීමෙන් පසු සමාගම අවසාන වැට් බදු වගකීම පියවනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල බදු පිළිබඳ ආරවුල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ලංවිම වෙතින් ලැබිය යුතු අවසාන වැට් බද්ද සහ | පසුව අධ්‍යක්ෂක මණ්ඩල දෙකම අවශ්‍ය අනුමැතීන් ලබා දී ඇති අතර, ගෙවීම් ලේඛන සත්‍යාපනය කිරීමෙන් පසු ලංවිම | එකඟ නොවීම් නිරාකරණය කර හිඟ ශේෂය අයකර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | අනෙකුත් ලැබිය යුතු මුදල් රු. මිලියන 197.45 ක් විය. කෙසේ වෙතත්, ලංවිම එම ශේෂය ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාගම විසින් ලංවිම සමඟ ඇති මෙම එකඟ නොවීම විසඳීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | විසින් සී.එස්.සී වෙත රු. මිලියන 80.90 ක අරමුදල් මුදා හැරීමට කටයුතු කරනු ඇත. සී.එස්.සී සහ එල්.සී.සී යන දෙපාර්ශවය විසින් සිදු කරන ලද ද්විගුණනය වූ වැට් බදු ගෙවීමක් නියෝජනය කරන බැවින්, රු. මිලියන 114.80 ක් වූ මුදල එල්.සී.සී හි පොත්වල ලංවිම වෙතින් ලැබිය යුතු මුදල සී.එස්.සී වෙත ගෙවිය යුතු මුදලට එරෙහිව කපා හැරීමෙන් අභ්‍යන්තර ගිණුම්කරණ සටහනක් හරහා ගැලපිය යුතුය. | කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, සමාගම විසින් සීමාසහිත ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් වෙතින් දිගුකාලීනව ලැබිය යුතු පිළිවෙලින් රු. මිලියන 589.97 ක සහ රු. 244.83 ක ශේෂයන් අයකරගෙන නොතිබූ අතර, හානිකරණය සඳහා ප්‍රතිපාදන ගිණුම්ගත කර නොතිබුණි. තවද, සී.එස්.සී.එල් සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් විසින් එම ශේෂයන් තහවුරු කර නොතිබූ බැවින්, විගණනයට එවැනි ශේෂයන්ගේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | **ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු මුදල – රු. 589,973,845**<br>මෙම දිගුකාලීන හිඟ ලැබිය යුතු ශේෂය පියවන ලෙස ඉල්ලා ලංවිම සාමාන්‍යාධිකාරි විසින් 2024.05.10 දිනැති ලිපියක් ද ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.<br>2025 සැප්තැම්බර් 03 වන දින පැවති විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම කරුණ සාකච්ඡා කරන ලද අතර, ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී) විසින් මෙම කරුණ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගන්නා තෙක් එල්.සී.සී වෙත ගෙවිය යුතු මුදල සී.එස්.සී වෙත ගෙවිය යුතු ගෙවීම්වලින් වාරික වශයෙන් අයකර ගත යුතු බවට කමිටුව විසින් නියම කරන ලදි. මෙම තීරණය එල්.සී.සී සාමාන්‍යාධිකාරි විසින් 2025 සැප්තැම්බර් 08 දිනැති ලිපිය මගින් සී.එස්.සී සභාපති වෙත දැනුම් දෙන ලදි.<br>පසුව විගණන කමිටු සභාපතිවරයාට සහ එල්.සී.සී හි සාමාන්‍යාධිකාරිගේ ලිපියට යොමුව දක්වමින් ලංවිම සාමාන්‍යාධිකාරි විසින් අයවිය යුතු මුදල ඉල්ලා එල්.සී.සී හි සභාපති වෙත 2025.09.19 දිනැති ලිපියක් නිකුත් කර ඇත.<br><br>**ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් – රු. 236,785,640.00**<br>වර්තමානයේදී, නීතිපති දෙපාර්තමේන්තුව විසින් බේරුම්කරණ විනිශ්චය සභාවෙන් ලද තීරණ ප්‍රකාශනය අනුමැතිය සඳහා වාණිජ මහාධිකරණයේ | දිගු කාලීන හිඟ මුදල් අයකර ගැනීමට සහ සුදුසු හානිකරණ ප්‍රතිපාදනයක් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විනිසුරුවරයා වෙත ඉදිරිපත් කර ඇත. | |
| (එ) | මුළු වෙළඳ ගෙවිය යුතු ශේෂයන් අතරින්, සීමාසහිත ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) සහ ලංවිම (ලිබර්ටි සහ ටෝරියන් සඳහා) වෙත ගෙවිය යුතු පිළිවෙලින් රු. මිලියන 473.62 ක සහ රු. මිලියන 714.97 ක හිඟ ශේෂ දෙකක්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වසර දෙකකට වැඩි කාලයක සිට පියවීමෙන් තොරව පැවතුණි. | අ. 2025 පෙබරවාරි 19 වන දින බලශක්ති අමාත්‍යාංශයේ පැවති රැස්වීමෙන් පසුව,<br>i. එල්.සී.සී සහ ලංවිම යන දෙඅංශයේම අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතියට යටත්ව, එල්.සී.සී / ලංවිම විසින් සී.එස්.සී වෙත රු. මිලියන 80.90 ක මුදලක් ගෙවිය යුතු බවට නිර්දේශ කරන ලදි.<br><br>ii. රු. 127,580,461.49 ක මුදල එල්.සී.සී සහ ලංවිම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කරන ලද අතර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.<br><br>iii.2021/2022 ගල් අඟුරු වාරය සඳහා සී.එස්.සී වෙත ගෙවිය යුතු ශේෂයෙන් රු. 145,261,997 ක් එල්.සී.සී විසින් රඳවාගෙන ඇති අතර, එම laytime ගණනය කිරීම් සඳහා අදාළ පාර්ශවයන් එකඟ වූ පසු සී.එස්.සී වෙත ගෙවිය යුතු මුදල් පියවනු ඇත.<br><br>iv.එල්.සී.සී විසින් ශ්‍රී ලංකා රේගුවට නැව් බඩු තොග අංක 123 සඳහා රු. 29,266,966 ක් වැට් බදු සඳහා වැඩිපුර ගෙවා ඇති අතර එල්.සී.සී විසින් රේගුවට ගෙවිය යුතු හිඟ ශේෂයන්ට එරෙහිව මෙම වැඩිපුර ගෙවූ වැට් බද්ද පියවීමට සුදුසු විධිවිධාන ගනු ඇත.<br><br>ආ. රු.714,965,434 : ලංවිම (ලිබර්ටි සහ ටෝරියන්) වෙත ගෙවිය යුතු<br>මුදල් ලද පසු ලංවිම වෙත ගෙවිය යුතු අතර ගිවිසුමට අනුව ගිණුම් අතර වෙනස මිල ඉහළ යාම මගින් පැහැදිලි කෙරේ. | එකඟ නොවීම් නිරාකරණය කර ගෙවිය යුතු ශේෂය පියවීමට කටයුතු කළ යුතුය. |
| | **සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම** | | |
| (ඒ) | මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවේ 5.5 ඡේදයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් ශුද්ධ ගිණුම්කරණ සහ ශුද්ධ එකතු ගිණුම්කරණ ක්‍රමවේද යටතේ සිදු කර තිබූ රු. මිලියන 2,855.27ක් වූ සූර්ය බලශක්ති මිලදී ගැනීම්වල පිරිවැය විකුණුම් පිරිවැය ලෙස හා ඊට අනුරූපී වගකීම මූල්‍ය ප්‍රකාශනවල | ප්‍රායෝගිකව, වහල මත සූර්ය පද්ධති ලෙකෝ හි ජාලයට භෞතිකව සම්බන්ධ වේ. ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විදුලිය මිලදී ගන්නා එකම නීත්‍යානුකූල ගැනුම්කරු වන අතර, වහල මත සූර්ය ජනක යන්ත්‍ර සඳහා ගෙවීම් ලෙකෝ විසින් ක්‍රියාකාරීව සකසනු ලැබේ. නෛතිමය රාමුව සමඟ | ආදායමට ආරෝපණය කළ හැකි විකුණුම් පිරිවැය හඳුනා ගැනීම, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී සූර්ය බලශක්ති පිරිවැය ඇතුළත් ඒකාකාර ජාතික ගාස්තුවට (UNT) අදාළව රු. මිලියන 1,590.93 ක ගැලපීමක් හඳුනාගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා විකුණුම් පිරිවැය රු. මිලියන 1,264.34 කින් අඩුවෙන් දක්වා තිබූ අතර ලාභය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි. | මෙය සමපාත කිරීම සඳහා, ලෙකෝ සහ අනෙකුත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා වෙතින් එවැනි ගෙවීම් අයකර ගැනීම අවශ්‍ය කරමින් PUCSL විසින් නියෝග නිකුත් කර ඇත. අතිරේකව, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් මෙම ප්‍රභවයන්ගෙන් බලශක්තිය භාවිතා කරන බැවින්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් අනුරූප බලශක්තිය සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත ඉන්වොයිස් නිකුත් කරන අතර, ඒකාකාර ජාතික ගාස්තු යාන්ත්‍රණය හරහා ගලා ඒම් සහ ගලා යැම් යන දෙකම කෘතිමව ගැලපීම් කරනු ලබයි. මෙම ක්‍රමවේදය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති/ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සමඟ අනුකූලතාවය සහතික කරන අතර මූල්‍ය ප්‍රකාශනවල ගනුදෙනුවේ ආර්ථික සාරය විශ්වාසනීයව ඉදිරිපත් කරයි. | |
| (ඔ) | දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වන වගන්තියට අනුව, වත්කම්වල අවශේෂ වටිනාකම සහ ඵලදායි ජීව කාලය සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂා කරන වටිනාකම පෙර ඇස්තමේන්තු වටිනාකමට වඩා වෙනස් වන්නේ නම්, ශ්‍රී.ලං.ගි.ප්‍ර 8 ට අනුකූලව වෙනස්කම් ගිණුම්ගත කළ යුතුය. කෙසේවෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට කාණ්ඩ 4 කට අදාළව රු. මිලියන 11,978.83 ක ධාරණ වටිනාකමක් ඇති වත්කම් ප්‍රමිතියට අනුව අවශ්‍ය පරිදි සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි. | කළමනාකරණය 2025 දී බෙදාහැරීමේ වත්කම් හැර අනෙකුත් වත්කම් පන්ති සඳහා වත්කම් වටිනාකම් සහ ක්ෂය ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමට උත්සාහ කරනු ඇත. තවද, ශ්‍රී.ලං.ගි.ප්‍ර 8 සමඟ මෙම අනුකූල නොවීම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත. | දැනටමත් භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

**1.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | “ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට දීමනා ගෙවීම” යන මාතෘකාව යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 07/1955/332/045 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය, 2008 මාර්තු 31 දිනැති ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා වාර්තාව සමඟ 2008 අප්‍රේල් 09 දින රැස් | මේ සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා 2024.06.24 දින බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යවා ඇත.<br>මෙම කාරණය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් හෝ සුදුසු කමිටුවක් පත් කරන ලෙස විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දීමට තවදුරටත් | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී සහ කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා |

| | | | |
|---|---|---|---|
| | වූ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා තිබුණු අතර අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් එහි වාර්තාවේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මේ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2008 අප්‍රේල් 09 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් කර නොතිබූ දීමනා සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 1.060.02 ක් ගෙවා තිබුණි. තවද, ඉහත අමාත්‍ය මණ්ඩල තීර්ණයට පටහැනිව, වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන්ට 601 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රඳවා ගැනිමේ දීමනාව ලෙස රු. මිලියන 191.3 ක් ගෙවා තිබුණු අතර තනතුරකට පත් කරන ලද නිලධාරීන්ට එම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා දීමනා ද ගෙවා තිබුණි. ඊට අමතරව, එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, 2008 අප්‍රේල් 01 දිනෙන් පසුව බඳවා ගන්නා ලද සේවකයින් සඳහා කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුන්වා දී නොතිබුණි. | තීරණය කරන ලදි. ඒ අනුව, 2025.04.21 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ලිපියක් යවා ඇත. ලං.වි.ම උප සභාපතිවරයාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් විසින් සකස් කරන ලද කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා යෝජනා ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. 2025.07.08 දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලද පරිදි, කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා වන යෝජනාව සලකා බැලීම සඳහා විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයට යවන ලදි. | කොමිෂන් සභාවේ නිර්දේශවලට අනුකූල විය යුතුය. |
| (ආ) | මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, සහනාධාර නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ . 2013 සිට 2024 දක්වා සේවකයින් විසින් ලබාගෙන ඇති දේපල ණය සඳහා අය කරන ලද පොලියෙන් 2/3 ක් එනම් රු. මිලියන 19,384.8 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා 2025.02.20 දින විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව වර්ෂ ගණනාවක සිට සිදු කරන ලද මෙම ක්‍රියාකාරකම සඳහා මහා භාණ්ඩාගාරයේ කැමැත්ත අතීතයට බලපාන පරිදි ලබා දිය නොහැකි බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා ඇත. තවද, විදුලිබල ක්ෂේත්‍රයේ සිදුකරමින් පවතින ප්‍රතිසංස්කරණ සමඟ ස්ථාපිත කරන ලද නව සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ සමාගම්වල සේවකයින්ට ලබා දෙන සේවක සහන සහ වරප්‍රසාද | සහනාධාර නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| | සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කෙසේද යන්න තීරණය කරනු ඇත. | |

## 1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.7.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වෙළඳ ණයගැතියන්**<br>(i) 2024 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය වූ රු. මිලියන 51,063.12 අතරින්, දීර්ඝ කාලයක සිට හිඟ මුදල් අයකර නොගැනීම හේතුවෙන් රු. මිලියන 3,099.83 ක් අවසන් කරන ලද ණයගැති ශේෂයක් ලෙස වර්ගීකරණය කර තිබූ අතර එයින් බෙදාහැරීමේ අංශවලට අයත් රු. මිලියන 2,263.16 ක් වර්ෂ 3 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | **බෙදාහැරීමේ අංශය - 01**<br>අවසන් කරන ලද ණයගැතියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අඛණ්ඩව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර නිශ්චිත ගනුදෙනුකරුවන්ට එන්තර වාසි යැවීමට සහ ක්‍රියා පටිපාටියට අනුව පසු විපරම් කිරීමට පියවර ගෙන ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය - 02**<br>හිඟ මුදල් අයකර ගැනීමට සහ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග අඛණ්ඩව ගනිමින් සිටී. නැගෙනහිර පළාතේ මුළු අවසන් කරන ලද තොග සැපයුම් අතරින්, සියයට 85 ක් ගනුදෙනුකරුවන් දෙදෙනෙකු (එකතුව රු. 219,843,360.70 කි.) නියෝජනය කළ අතර, එනම් වාලච්චේන කඩදාසි සංස්ථාව සහ කන්තලේ සීනි සංස්ථාවයි.<br>**බෙදාහැරීමේ අංශය - 03**<br>ශේෂයන් නිරවුල් කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>• සාමාන්‍ය සහ තොග ණය ගැතියන් යන දෙපාර්ශවයේම අවසන් කරන ලද ගිණුම්වල ශේෂයන් ආරක්ෂක තැන්පතුවලින් අයකර ගැනීම.<br>• වසර දෙකකට අඩු දිගුකාලීන හිඟ ශේෂයන් සහ අවසන් කරන ලද ගිණුම් සඳහා සිහි කැඳවීම් යැවීම.<br>• පැහැර හරින ලද අවසන් කරන ලද පාරිභෝගිකයින්ගේ ක්‍රියාකාරී ගිණුම් හඳුනාගෙන ශේෂයන් ක්‍රියාකාරී ගිණුම් වෙත මාරු කිරීම.<br>**බෙදාහැරීමේ අංශය - 04**<br>නිරවුල් කිරීමට පියවර ගනු ඇත. අවසන් කරන ලද ණයගැතියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට අඛණ්ඩව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර, නිශ්චිත ගනුදෙනුකරුවන්ට එන්තර වාසි යැවීමට සහ ක්‍රියා පටිපාටියට අනුව පසු විපරම් කිරීමට පියවර ගනු ලබයි. | දිගු කාලීන හිඟ ණයගැතියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | නියදි විගණන පරීක්ෂණයට අනුව, දීර්ඝ කාලයක සිට රු. මිලියන 29.3 ක හිඟ විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ නිල නිවාස සඳහා ලබාදී ඇති විදුලි සම්බන්ධතා ගිණුම් 84 ක් අවසන් කර තිබුණි. අයකර ගැනීමෙන් තොරව එයින් රු. මිලියන 20.14 ක් වර්ෂ පහකට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරි සහ කොළඹ නගරය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි විසින් අඛණ්ඩව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම හිඟ මුදල්වල වත්මන් තත්ත්වය පිළිබඳව කොළඹ දකුණ ප්‍රධාන ඉංජිනේරු විසින් යාවත්කාලීන කිරීමක් ලබා දී ඇති අතර, දැනටමත් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. | පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ නිල නිවාසවලට ලබා දී ඇති සම්බන්ධතාවලින් හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ)<br>(i) | **අනෙකුත් ණයගැතියන්**<br>2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 20,429.02 ක් වූ අනෙකුත් ණයගැති ශේෂය අතරින් රු. මිලියන 10,546.2 ක් වර්ෂයට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී විදුලි සැපයීම වෙනුවෙන් පූජනීය ස්ථානවලින් රු. මිලියන 126.54 ක් අයවිය යුතුව පැවතුන අතර ඒ අතරින් රු. මිලියන 23.86 ක් වර්ෂ පහකට වැඩි කාලයක සිට අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. | **බෙදාහැරීමේ අංශය - 01**<br>ගෙවීමේ වගකීම අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වන අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට බහුවිධ පසු විපරම් සහ විධිමත් සිහිකැඳවීම් නිකුත් කර ඇතත්, කාරණය තවමත් විසඳී නොමැත.<br>**බෙදාහැරීමේ අංශය - 03**<br>රු. මිලියන 51 ක ශේෂය කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිකාවක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා විගණන කමිටු නිර්දේශය තවමත් ලැබී නොමැත.<br>**බෙදාහැරීමේ අංශය - 04**<br>රු. මිලියන 126.54 අතරින්, රු. මිලියන 58 ක් බෙදාහැරීමේ අංශය 04 හි දකුණ පළාත 2 සඳහා අදාළ වේ. පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් සඳහා දැනටමත් ප්‍රතිපාදන සලසා ඇත. වර්තමානයේදී, සූර්ය සම්බන්ධතාවයක් මගින් මාසිකව පියවා ගනු ලබන එක් ගිණුමක් හැර සියලුම ලැබිය යුතු මුදල් දකුණ පළාත 2 විසින් එකතු කර ඇත. | අනෙකුත් ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ii) | අනෙකුත් ණයගැතියන් අතරින් 2024 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැතියන්ගෙන් රු. මිලියන 2,577.59 ක් අයවිය යුතුව පැවතුණි. ඒ අතරින් රු. මිලියන 787.37 ක් වර්ෂයකට වැඩි කාලයක සිට සහ රු. මිලියන 252.75 ක් වර්ෂ පහකට වැඩි කාලයක සිට අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. | **බෙදාහැරීමේ අංශය 01**<br>**කොළඹ නගර කලාපය**<br>පාරිභෝගික බල්බ ණය<br>විදුලි බිල්පත නොගෙවීම හේතුවෙන් සමහර පාරිභෝගික ගිණුම් අවසන් කර ඇත. එම නිසා, ණය අයකර ගැනීම ප්‍රමාද වී ඇත. මෙම ශේෂයන් අයකර ගැනීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ඇත.<br>තාවකාලික විදුලි සැපයු<br>ඒවා අයකර ගැනීම සඳහා මෙම ආයතන වෙත සිහි කැඳවීමේ ලිපි යවා ඇත. හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගනිමින් සිටී.<br>මුදල් හිඟය<br>රු. 2,661,961.00 ක මුදල විවිධ ණයගැතියන් තුළ මුදල් හිඟයක් ලෙස ඇතුළත් කර ඇති අතර රු. 45,340.00 යනු | අනෙකුත් ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වර්ෂ පහකට වැඩි කාලයක් හිඟව තිබූ අඟුරු චෙක්පත් මුදල වේ.<br>පාඩු අයකර ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව ගොනු කර ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 02**<br>පොත්වලින් රු. මිලියන 9.7 ක් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිකාවක් සකස් කිරීමට කටයුතු කරනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 03**<br>2025 මැයි මාසය වන විට නිරවුල් කරන ලද විදේශීය ප්‍රසම්පාදන සඳහා කරන ලද අත්තිකාරම් ගෙවීම් විවිධ ණයගැතියන්ගේ ශේෂයට ප්‍රධාන වශයෙන් ඇතුළත් වේ.<br>**බෙදාහැරීමේ අංශය 04**<br>දිගුකාලීන හිඟ ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ඇත. | |
| (iii) | රු. මිලියන 348.29 ක මුළු ලැබිය යුතු මුදල්වලින්, 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 101 කින් රු. මිලියන 344.96 ක් අයවිය යුතුව පැවතුණි. රජයේ ආයතනවලින් ලැබිය යුතු මුදල්වලින් රු. මිලියන 80.42 ක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ පහකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | ඩීසල් ජනන යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර සහ සෝපාන සැපයීම සඳහා රජයේ ආයතනවලට අදාළ හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා පහත පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>• 'විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (MOPE) වෙතින් ලැබිය යුතු' ලෙස සටහන් කර ඇති රු.40,320,004.25 ක දිගුකාලීන හිඟ ශේෂය කපා හැරීමට MOPE විසින් ලංවිම සාමාන්‍යාධිකාරිවරයාට නියෝගයන් නිකුත් කර ඇත.<br>• අදාළ ගනුදෙනුකරුවන්ට හිඟ ශේෂයන් දැනුම් දීම.<br>• සිහි කැඳවීමේ ලිපි යැවීම. | රජයේ ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම (රු. මිලියන 478.18 ක්) සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් (රු. මිලියන 236.78 ක්) හරහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අය විය යුතු රු. මිලියන 714.96 ක් වර්ෂ දහයකට වැඩි කාලයක සිට අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. | ලංවිම හි උපදෙස්වලට අනුකූල නොවීම සහ LCC හා ගල් අඟුරු සැපයුම්කරුවන් අතර ගිවිසුමේ සූත්‍රවල වැරදි හේතුවෙන් ඇති වූ මූල්‍ය පාඩුව ආපසු ගෙවීමට LCC සම්පූර්ණයෙන්ම බැඳී සිටින බැවින් ලංවිම ගිණුම් පොත්වල මෙම දිගුකාලීන හිඟ ලැබිය යුතු ශේෂය පියවන ලෙස ඉල්ලා ලංවිම සාමාන්‍යාධිකාරී විසින් 2024.05.10 දිනැති ලිපියක් LCC හි සභාපතිවරයා වෙත ද නිකුත් කර ඇත.<br>2025 සැප්තැම්බර් 03 වන දින පැවති විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම කරුණ සාකච්ඡා කරන ලද අතර, ලංකා නැව් සංස්ථාව (CSC) විසින් | අනාගතයේදී මෙවැනි ගනුදෙනු වැළැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෙම කරුණ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගන්නා තෙක් ලංකා ගල් අඟුරු සමාගමට ගෙවිය යුතු මුදල ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ගෙවීම්වලින් වාරික වශයෙන් අයකර ගත යුතු බව කමිටුව විසින් නියම කරන ලදි. මෙම තීරණය LCC සාමාන්‍යාධිකාරි විසින් CSC හි සභාපති වෙත දැනුම් දෙන ලදි. පසුව, විගණන කමිටුවේ සභාපති සහ සාමාන්‍යාධිකාරි - LCC ලිපියට යොමුව දක්වමින් හිඟ ශේෂය පියවන ලෙස ඉල්ලා ලංවිම සාමාන්‍යාධිකාරි විසින් 2025.09.19 දිනැති ලිපියක් LCC හි සභාපති වෙත නිකුත් කර ඇත. | |
| (v) | 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ලබා දෙන ලද තාවකාලික විදුලි සම්බන්ධතාවලින් රු. මිලියන 275.24 ක් අයවිය යුතුව පැවතුණි. ඒ අතරින්, කොළඹ නගර කලාපය විසින් රජයේ ආයතනවලට ලබා දෙන ලද තාවකාලික විදුලි සම්බන්ධතාවලින් රු. මිලියන 223.13 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. | රජයේ ස්ථාපන (GI) ඒකකය විසින් සපයා ඇති සැලකිය යුතු වටිනාකමක් තිබියදීත්, ගෙවීම් ලැබීමට පෙර හදිසි ඉල්ලීම්වලට ප්‍රමුඛත්වය දීමේ නිතර නිතර ඇති වන අවශ්‍යතාවය ප්‍රධාන අභියෝගයක් වේ. රැස්වීම් සහ සිහිකැඳවීම් ලිපි ඇතුළු ගෙවීම් එකතු කිරීමට නැවත නැවතත් උත්සාහයන් ගෙන ඇත. | තාවකාලික විදුලි සම්බන්ධතා හේතුවෙන් අයවිය යුතු දිගුකාලීන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vi) | 2024 දෙසැම්බර් 31 වන දිනට සම්ප්‍රේෂණ අංශයේ විවිධ ණයගැතියන් ලෙස රු. මිලියන 650.2 ක මුදලක් පැවතුන අතර ඒ අතරින්, රු. මිලියන 220.5 ක මුදලක් වර්ෂ 2 ක වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. | ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ලැබිය යුතු රු.4,566,342.04 ක මුදලක් වසර 30 ක් තුළ ක්‍රමක්ෂය කරනු ඇත. ලැබිය යුතු ඉතිරි මුදල සඳහා පියවර ගනු ඇත. | සම්ප්‍රේෂණ අංශය සඳහා විවිධ ණයගැතියන් ලෙස අයවිය යුතු දිගුකාලීන හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වගකිවයුතු නිලධාරීන් සමඟ හඳුනාගෙන ඇති තොග පාඩුවලට අදාළව එකතුව රු. මිලියන 28.03 ක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂයකට වැඩි කාලයක සිට විවිධ ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, බෙදාහැරීමේ අංශ, ජනන අංශය සහ වත්කම් කළමනාකරණයට අදාළව එකතුව රු. මිලියන 92.91 ක් වූ තොග හිඟයන් විමර්ශනය කර නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක සිට පොත්වල පැවතුණි. | **බෙදාහැරීමේ අංශය - 02**<br>රු.19,350,308 ක තොග හානිය සඳහා වන නඩුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හසුරවනු ලබන අතර රු.598,530 ක තොග හානිය සඳහා චෝදනා පත්‍රය නිකුත් කර ඇත.<br><br>**ජනන අංශය**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත පදනම්ව මෙම ශේෂය පියවීමට ඉදිරි පියවර ගනු ඇත.<br>**බෙදාහැරීමේ අංශය 03**<br>බස්නාහිර පළාත දකුණ 2 හි තොග ගැලපුම් ශේෂය සම්බන්ධයෙන්, අභ්‍යන්තර විගණන කණ්ඩායම ඔවුන්ගේ විමර්ශනය සිදු කර ඇති අතර වාර්තාව පිළියෙල කරමින් පවතී. | තොග හිඟය නිසා ඇති වූ පාඩු වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට වහාම කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තවද, සබරගමුව පළාතේ ද තොග ගැලපුම් ශේෂයන් සමාලෝචනය කිරීමට සහ එම කමිටු නිර්දේශ සහ අවශ්‍ය අනුමැතීන් මත පදනම්ව හිඟයන් සහ අතිරික්තයන් නිරවුල් කිරීම සඳහා කටයුතු කිරීමට කමිටු පත් කර ඇත.<br><br>**වත්කම් කළමනාකරණ අංශය**<br>තොග හිඟ ශේෂයන් සම්බන්ධයෙන් දීර්ඝ කාලයක සිට පවතින විමසුම, විගණන කමිටු රැස්වීම්වලදී නිතිපතා පසු විපරම් කරනු ලබන අතර අවසන් තීරණයක් තවමත් ගෙන නොමැත. | |
| (ඈ) | මුළු අත්තිකාරම් සහ පෙරගෙවුම් ශේෂය වන රු. මිලියන 9,055.19 අතරින් ව්‍යාපෘතියඅංශයේ රු. මිලියන 144.93 ක් වර්ෂ 5 කට වැඩි කාලයකට සිට අය නොවී පැවතුණි. | **බෙදාහැරීමේ අංශය - 01**<br>මෙම ශේෂයන් විදේශීය මිලදී ගැනීම් හා සම්බන්ධ වන අතර අවශ්‍ය ලියකියවිලි ලද පසු නිවැරදි කරනු ඇත.<br>**මූලස්ථානය**<br>ලංවිම වෙනුවෙන් ලංවිම සේවකයින්ට ඔවුන්ගේ විශ්‍රාම යාමේදී පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කිරීම සඳහා රු. මිලියන 30 ක අත්තිකාරමක් ලංවිම විශ්‍රාම වැටුප් අරමුදලට ලබා දී තිබූ අතර මෙම අත්තිකාරම විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා යොදා ගන්නා අතර එවැනි ගෙවීම් පියවීමෙන් පසු ලංවිම විසින් ප්‍රතිපූරණය කර ගැනීමට අපේක්ෂා කෙරේ.<br>ඉතිරි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය - 03**<br>අත්තිකාරම් සහ පෙරගෙවුම් අයකර ගැනීමට සහ පියවීමට අවශ්‍ය පියවර ගනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය - 04**<br><br>හිඟ ශේෂය නිරවුල් කිරීම සඳහා දැනට ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් සහ පෙරගෙවුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | රු. මිලියන 6,611.4 ක මුළු රඳවා ගැනීමේ ශේෂයෙන්, මූලස්ථානය හැර අනෙකුත් සියලුම අංශවලට අයත් රු. මිලියන 161.98 ක මුදලක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට නිරවුල් කිරීමට පියවර ගැනීමෙන් තොරව පැවතුණි. | **බෙදාහැරීමේ අංශය - 01**<br>අවශ්‍ය අනුමැතිය ඇතිව මෙම හිඟ ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගන්නා ලෙස පළාත් (ආදායම්) ගණකාධිකාරීවරුන්ට දැනුම් දී ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව දීර්ඝ කාලීනව පවතින රඳවා ගැනීමේ ශේෂයන් සමාලෝචනය කර නිරවුල් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | | **බෙදාහැරීමේ අංශය - 02**<br><br>දිගු කාලීනව හිඟව තිබූ රඳවා ගැනීමේ ගෙවිය යුතු මුදල නිරවුල් කිරීමට 2025 වර්ෂයේදී කටයුතු කරනු ඇත.<br><br>**ජනන අංශය**<br>ජනන මූලස්ථානය<br><br>කමිටු තීරණය සහ ව්‍යාපෘතියකළමනාකරුගේ තීරණය මත පදනම්ව, රඳවා ගැනීමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.<br><br>අනෙකුත් සංකීර්ණ<br>වර්ෂ පහකට වැඩි කාලයක සිට පවතින රඳවා ගැනීම් නිරවුල් කිරීමට 2025 දී කටයුතු කරනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය - 03**<br>අදාළ සැපයුම්කරුවන්ට/කොන්ත්‍රාත්කරුවන්ට නිසි සිහි කැඳවීමක් කිරීමෙන් පසු ඒවා ආදායමට බැර කිරීමට කටයුතු කරනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය - 04**<br><br>රු. මිලියන 6.8 ක් අදාළ ටෙන්ඩර්වලට අදාළ සියලුම ගෙවීම් අවසන් වූ පසු නිරවුල් කරනු ලබයි. වැඩිදුර තොරතුරු නොමැති විට සහ අයකර ගැනීම කළ නොහැකි යැයි සලකනු ලබන විට, එවැනි ශේෂයන් කපා හැරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>**ව්‍යාපෘති**<br>ව්‍යාපෘතියසඳහා රඳවා ගැනීමේ මුදල්, ඒවා රඳවා තබා ගැනීමට නිශ්චිත හේතුවක් නොමැති නම්, සාමාන්‍යයෙන් ව්‍යාපෘතිය අවසන් වූ පසු නිදහස් කරනු ලබයි. | කටයුතු කළ යුතුය. |

**1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ | නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් | දින 8 ක් ඇතුළත 2023 අගෝස්තු 15 වන දින වන විට අතිරේක විදුලිබලය මිලදී ගැනීමේ හදිසි අවශ්‍යතාවයක් | ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 43 (1) වගන්තිය | දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 1,720 ක් වූ ගිගාවෝට් පැය 24.93 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. | පැවති බැවින්, 'කෙටි කාලීන පදනමින් මෙගාවොට් 100 අතිරේක විදුලි බලයක් සැපයීම - 2023' යන ටෙන්ඩරයට අනුව යෝජනා සඳහා වන ඉල්ලීමේ නියමයන් සහ කොන්දේසි යටතේ ක්ෂණික පදනමක් මත මාස 6 ක කාලයක් සඳහා අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය වූ කිලෝවොට් පැය 94,500,000 ක් යටතේ විදුලිය මිලදී ගැනීම සඳහා ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒස් පවර් ජේනරේෂන් මාතර (පුද්ගලික) සමාගම වෙත ප්‍රදානය කිරීමේ ලිපියක් නිකුත් කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. මෙගාවොට් 93 ක ධාරිතාවයකින් යුත් ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගමේ බලාගාරයට පෙර මෙගාවොට් 23.75 ක ධාරිතාවයකින් යුත් ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්ගලික) සමාගමේ බලාගාරය අනුමත කර ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, මෙගාවොට් 100 ඉක්මවා මෙගාවොට් 116.75 ක මුළු ධාරිතාවය මිලදී ගැනීමට සිදු විය. | |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වන වගන්තිය | 2025 ජනවාරි 31 දින නිකුත් කරන ලද 2023 වර්ෂය සඳහා සවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් මාස තුනක් ඇතුළත, එම වාර්තාවේ පෙන්වා දී ඇති ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව හෝ නොහැකියාව සඳහා හේතු දක්වමින් යෝජිත සැලකිල්ලට ගත යුතු ක්‍රියාමාර්ග සහ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | යෝජිත ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග 2025 නොවැම්බර් 03 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | ජාතික විගණන පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර | | | |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත | | | |
| (i) | වගන්ති අංක 3.1 සහ 3.2 (i) | රජය සතු ව්‍යවසායක බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු අතර, එහි පිටපතක් අදාළ වන පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | 2025.06.24 දින පැවති අමාත්‍යාංශ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී ලබා දුන් උපදෙස් අනුව, සාමාන්‍යාධිකාරි විසින් 2002 දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පවතින බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජනා ක්‍රමය (SORP), පසුව කරන ලද සංශෝධන සහිතව සාමාන්‍යාධිකාරි විසින් 2025.07.04 දිනැති සාමාන්‍යාධිකාරිගේ ලිපිය මගින් බලශක්ති අමාත්‍යාංශයට යොමු කර ඇත. පසුව, අමාත්‍යාංශය විසින් මෙම SORP කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) ආකෘතියට අනුකූලව ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇති අතර, මෙම කාර්යය සිදුකරමින් පවතී. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම. |
| (ii) | වගන්ති අංක 3.4 | සෑම රජය සතු ව්‍යවසායයක්ම තම මානව සම්පත් අවශ්‍යතා නිසි ලෙස හඳුනාගෙන සැලසුම් කර ඇති බවට සහතික විය යුතුය. එවැනි සැලැස්මක් මඟින් පුරප්පාඩු, නිර්මාණය කළ යුතු නව තනතුරු සහ තනතුර සඳහා අවශ්‍ය කුසලතා හඳුනාගත යුතුය. සෑම රජය සතු ව්‍යවසායයකටම අනුප්‍රාප්තික සැලැස්මක් තිබීම ද අවශ්‍ය වේ. කෙසේ වෙතත්, මණ්ඩලය එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | 2025.06.24 දින පැවති අමාත්‍යාංශ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී ලබා දුන් උපදෙස් අනුව, 2002 දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පවතින SORP, පසුව කරන සංශෝධන සහිතව සාමාන්‍යාධිකාරි විසින් 2025.07.04 දිනැති සාමාන්‍යාධිකාරිගේ ලිපිය මගින් බලශක්ති අමාත්‍යාංශයට යොමු කර ඇත. පසුව, අමාත්‍යාංශය මෙම SORP, MSD ආකෘතියට අනුකූලව ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇති අතර, මෙම කාර්යය සිදුකරමින් පවතී. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | වගන්ති අංක 3.4 (ix) | සුවිශේෂී තත්වයන් යටතේ වැඩ බලන පත්වීමක් සිදු කරන්නේ නම්, එය වර්ෂයක් (1) නොඉක්මවන කාලයකට සීමා විය යුතුය. කෙසේ වෙතත්, මණ්ඩලයේ විධායක ශ්‍රේණියේ වගකිවයුතු තනතුරක් වන ප්‍රධාන නීති නිලධාරී තනතුර සඳහා වැඩ බලන පදනම මත පත් කර ඇති නීති නිලධාරියා වර්ෂ 11 කට වැඩි කාලයක සිට වැඩ බලන පදනම මත එම තනතුරේ සේවය කර ඇති බව නිරීක්ෂණය විය. | ප්‍රධාන නීති නිලධාරි මට්ටම I පන්තියට උසස් කිරීමට සහ බාහිර බඳවා ගැනීම් මත පදනම්ව සුදුසු ප්‍රධාන නීති නිලධාරියෙකු බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා, අභියාචනාධිකරණයේ අතුරු තහනම් නියෝගයක් හේතුවෙන් තාවකාලිකව අත්හිටුවන ලද පවතින SORP සංශෝධනය කිරීමට අවශ්‍ය විය. මේ අතරතුර, රජයේ ප්‍රතිපත්තියට අනුකූලව, 2023 නොවැම්බර් දක්වා සියලුම බාහිර බඳවා ගැනීම් නැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදි. මෙම හේතු දෙක නිසා, බාහිරව සුදුසු ප්‍රධාන නීති නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා දැන්වීමක් පළ කිරීමට කළමනාකාරිත්වයට නොහැකි විය. කෙසේ වෙතත්, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට අවධානය යොමු කරනු ඇත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම. |
| (iv) | වගන්ති අංක 3.5 | සමාලෝචිත වර්ෂය තුළදී, රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් දාහතක් සඳහා වැටුප්, දීමනා සහ දිරි දීමනා ලෙස මණ්ඩලය විසින් රු. මිලියන 34.75 ක මුදලක් ගෙවා තිබූ අතර 2020 සිට 2024 දක්වා ගෙවන ලද මුළු මුදල රු. මිලියන 323.41 ක් විය. | එම මුදල ලංවිම වෙත ආපසු ගෙවීමට සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශයට ලිවීමට පියවර ගන්නා ලදි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම. |
| (v) | වගන්තිය අංක 7.7 | 2025 මාර්තු මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත සමාගම් සමාලෝචන කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණද, අධ්‍යක්ෂ මණ්ඩලයට තම විෂය පථයට අයත් පරිපාලිත සමාගම්වල කාර්ය සාධනය අධීක්ෂණය කිරීමට සහ අවම වශයෙන් කාර්තුමය වශයෙන් පරිපාලිත සමාගම්වල කාර්ය සාධනය | 2023 මැයි 30 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී, ලංවිමහි සිදු කරමින් ඇති සහ යෝජිත ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම් සලකා බලා, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙම අවස්ථාවේදී පරිපාලිත සමාගම් සමාලෝචන කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම අවශ්‍ය නොවිය හැකි බව තීරණය කරන ලදි. 2023 මැයි 30 දිනැති අංක | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | සාකච්ඡා කිරීමට පහසුකම් සපයන ව්‍යුහයක් ස්ථාපිත කිරීමට භාරකාර යුතුකමක් ඇත. | 23.07.194.එච් දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මේ සමඟ අමුණා ඇත. | |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.3 වගන්තිය | අවම වශයෙන් කාර්තුමය වශයෙන් රැස්වීමට අවශ්‍ය වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | සිදු කරමින් පවතින ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු ඉහත මූලපිරීම ක්‍රියාත්මක කිරීම වඩාත් විචක්ෂණශීලී, ආර්ථිකමය සහ ඵලදායී ලෙස සැලකේ. ඊට අමතරව, දේශපාලන තත්ත්වයේ මාරුවීම් සහ කමිටු සාමාජිකයින්ගේ වෙනස්කම් 2024 අගභාගයේදී අවධානම් කමිටු රැස්වීම් අත්හිටුවීමට හේතු විය. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම. |
| (ඉ) | වගන්ති අංක 3.2(v) සහ 1994 ජුනි 14 දිනැති පී.ඊ.ඩී චක්‍රලේඛ අංක 95 | 2013 සිට 2019 දක්වා කාලය තුළදී මණ්ඩලය විසින් රු. මිලියන 5,780 ක ලබා නොගත් අසනීප නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි. 2020 සැප්තැම්බර් 25 වන දින විදුලිබල අමාත්‍යාංශයේ පැවති විගණන කමිටු රැස්වීමේදී, ලබා නොගත් අසනීප නිවාඩු වෙනුවෙන් ගෙවීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට තීරණය කරන ලද අතර, 2021 පෙබරවාරි 02 වන දින පැවති විගණන කමිටු රැස්වීමේදී, ලබා නොගත් අසනීප නිවාඩු වෙනුවෙන් ගෙවීම අවිධිමත් ගෙවීමක් බැවින් වහාම නතර කිරීමට තීරණය කරන ලදි. කෙසේ වෙතත්, ඊට පටහැනිව, 2020, 2021 සහ 2024 වර්ෂ සඳහා පිළිවෙලින් රු. මිලියන 1,201 ක්, රු. මිලියන 1,542 ක් සහ රු. මිලියන 1,641 ක් ලබා නොගත් අසනීප නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි. | 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ අංක 12(ජේ), (කේ), (එම්) සහ (එන්) වගන්ති යටතේ මණ්ඩලයට පවරා ඇති බලතල යටතේ, 1984 සිට 2020 දක්වා ලංකා විදුලිබල මණ්ඩල සේවකයින්ට ලබා නොගත් අසනීප නිවාඩු වෙනුවෙන් දිරි දීමනාවක් ගෙවා ඇත. ඒ අනුව, 2021 සහ 2024 වර්ෂ සඳහා මෙම දිරි දීමනාව ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති අනුමැතියන්ට අනුව ගෙවා ඇත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම. |
| (ඊ) | 1998 මාර්තු 08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 130 | වාහන ණය සියයට 10 සිට සියයට 14 දක්වා පොලී අනුපාතයකට ලබා දිය යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, මණ්ඩලය සිය සේවකයින්ට සියයට 4.2 ක පොලී අනුපාතයකට වාහන ණය ලබා දී තිබුණි. | 2024.09.11 දින පැවති අමාත්‍යාංශ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී උපදෙස් දී ඇති පරිදි, මේ සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා 2024.11.13 දින විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යවා ඇත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව වසර ගණනාවක සිට සිදු කරන ලද මෙම ක්‍රියාකාරකම සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය අතීතයට බලපාන පරිදි ලබා දිය නොහැකි බවත් විදුලිබල ක්ෂේත්‍රයේ සිදු කරමින් පවතින ප්‍රතිසංස්කරණ සමඟ ස්ථාපිත නව සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ සමාගම්වල සේවකයින්ට ලබා දී ඇති සේවක සහන සහ වරප්‍රසාද සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න තීරණය කරනු ඇති බවත් දන්වා ඇත. | |
| (උ) | "රජය සතු ව්‍යවසායන්හි වියදම් කළමනාකරණය සහ ව්‍යාපාර තිරසාරභාවය" පිළිබඳ 2024 පෙබරවාරි 28 දිනැති මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 01/2024 හි වගන්ති අංක 12 | ගරු මුදල් අමාත්‍යතුමාගේ කිසිදු අනුමැතියකින් තොරව වර්ෂය තුළදී ආයතනික සමාජ වගකීම් වියදම් ලෙස ලක්විජය සංකීර්ණය විසින් රු. මිලියන 39.4 ක් වියදම් කර තිබුණි. | බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් හරහා භාණ්ඩාගාර ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත. | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛවලට දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම. |
| (උ◌a) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1.2 වගන්තිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ තනතුරු 03 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිලධාරීන් 04 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය තුළ ඇති පරිසර නිලධාරී/පරිසර සහකාර තනතුරු ඒකාබද්ධ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව, පරිසර සහකාරවරුන් 02 දෙනෙකු බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් සිදු කර ඇති බවට සහතික කිරීම. |

## 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 34 (1) වගන්තියට අනුව එකතු කළ අගය මත බදු තක්සේරු කිරීම්වලට එරෙහිව මණ්ඩලය විසින් අභියාචනා තුනක් නියමිත දින තුළ ඉදිරිපත් කර නොතිබුණි. | ඉහත අභියාචනා තුන ඉදිරිපත් කර තිබූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළිගෙන ඇත. | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදුවලට පෙර රු. මිලියන 144,394 ක ලාභයක් වූ අතර පසුගිය වර්ෂයේ අනුරූප ලාභය රු. මිලියන 57,633 ක් විය. (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව). එම නිසා, රු. මිලියන 86,761 කින් ලාභයේ විශාල වැඩිවීමක් නිරීක්ෂණය විය. ආදායම සියයට 10 කින් අඩු වුවද, විකුණුම් පිරිවැය සියයට 14 කින් අඩුවීම හේතුවෙන් දළ ලාභය සියයට 14 කින් වැඩිවීම, LTL හෝල්ඩින්ග්ස් හි කොටස් වෙස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පැවරීමෙන් ලද රු. මිලියන 26,038.09 ක ලාභය සහ මූල්‍ය පිරිවැය රු. මිලියන 41,360.3 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව විය.

තවද, සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදුවලට පෙර රු. මිලියන 189,627 ක ලාභයක් වූ අතර පසුගිය වර්ෂයේ අනුරූප ලාභය රු. මිලියන 75,234 ක් විය. (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව). එම නිසා, රු. මිලියන 114,392 කින් ලාභයේ විශාල වැඩිවීමක් නිරීක්ෂණය විය.

## 2.1 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත දැක්වේ.

| විස්තරය | විචල්‍ය මුදල වැඩිවීම/(අඩුවීම (රු.බිලියන) | විචලනය | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| ආදායම | (59.62) | 9.8 | 2024 වර්ෂය තුළදී පනවන ලද විදුලි ගාස්තු සංශෝධන හරහා බලශක්ති අනුපාත සහ මාසික ස්ථාවර ගාස්තු අඩු කිරීම. |
| විකුණුම් පිරිවැය | (73.08) | 14 | ඉන්ධන සහ ගල් අඟුරුවල පිරිවැය අඩුවීම (ගල් අඟුරු මිල සහ විනිමය අනුපාතය අඩුවීම), විදුලිය මිලදී ගැනීමේ පිරිවැය අඩුවීම. |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් සහ ලාභ | 32.89 | 104 | LTL හෝල්ඩින්ග්ස් හි කොටස් වෙස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පැවරීමෙන් ලද රු. මිලියන 26,038.09 ක ලාභය |
| මූල්‍ය පිරිවැය | 41.36 | 66 | පොලී අනුපාතය අඩුවීම, කාරක ප්‍රාග්ධනය සඳහා මුදල් යෙදවීම සඳහා ගනු ලැබූ බැංකු ණය සහ අයිරා අඩුවීම. |

## 2.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

### 2.2.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2024 දෙසැම්බර් 31 දිනට සමූහයේ කාරක ප්‍රාග්ධනය රු. මිලියන 90,022 ක ධන අගයක් ලෙසින් පිළිබිඹු වූ අතර පසුගිය වර්ෂයේ (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව) ඍණ ශේෂය රු. මිලියන 17,133 ක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 625 කින් වර්ධනය වී තිබුණි.

### 2.2.2 ස්කන්ධයට ණය

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2024 දෙසැම්බර් 31 දිනට සමූහයේ ස්කන්ධ ශේෂය රු. මිලියන 112,058 කින් හෙවත් සියයට 18 කින් වැඩි වී තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දිනට සමූහය විසින් යොදවා ඇති මුළු ප්‍රාග්ධනයෙන් සියයට 44 ක් හෙවත් රු. මිලියන 316,465 ක් ණය ලබාගැනීම මගින් මූල්‍යනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ස්කන්ධයට ණය අනුපාතය පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 64 සිට සියයට 44 දක්වා අඩු වී තිබුණි.

### 2.2.3 ලාභදායීතාවය

සමාලෝචිත වර්ෂයේ ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. 28.59 ක් වූ අතර ඊට සාපේක්ෂව 2023 වර්ෂයේ එය රු. 35.85 ක් (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව) වූ අතර ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 36.01 ක් යටතේ අලෙවි කර ඇත. (පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 42.86 කි). ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ඒකකයක සාමාන්‍ය දළ ලාභය රු. 7.42 ක් වූ අතර පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය දළ ලාභය වූ රු. 7.01 ට සාපේක්ෂව සාමාන්‍ය දළ ලාභය සියයට 06 කින් වැඩි වී ඇත. විදුලි ගාස්තු කාණ්ඩය සහ සමාලෝචිත වර්ෂය තුළදී අලෙවි කරන ලද විදුලි ඒකකයක දළ ලාභය පසුගිය වර්ෂය සමඟ සසඳා පහත වගුවේ දැක්වේ.

| කාණ්ඩය | ඒකකයක දළ ලාභය ( රු/කි.වො.පැයක )<br>2024<br>රු. | 2023 (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව)<br>රු. |
|---|---|---|
| ගෘහස්ථ | 5.55 | 7.81 |
| ආගමික | 1.85 | 7.35 |
| පොදු අරමුණු | 18.38 | 14.85 |
| හෝටල් | 2.33 | 6.43 |
| කාර්මික | 2.20 | 2.80 |
| රජය | 18.80 | 15.91 |
| ලෙකෝ වෙත තොග සැපයුම | 6.04 | 1.81 |
| වීදි ආලෝකකරණය | (28.49) | (35.82) |
| කෘෂිකර්මාන්තය | 13.98 | 13.75 |

| | | |
|---|---|---|
| ඒකකයක සාමාන්‍ය දළ ලාභය | **7.42** | **7.01** |

ඒ අනුව, වීදි ආලෝකකරණය හැර මණ්ඩලයේ අනෙකුත් සියලුම විදුලි ගාස්තු කාණ්ඩ සමාලෝචිත වර්ෂය තුළදී ධනාත්මක දළ ලාභයක් ජනනය කරන ලද අතර සාමාන්‍ය දළ ලාභයට ඉහළම දායකත්වය රාජ්‍ය අංශය විසින් ලබා දී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචන

### 3.1 කාර්ය සාධනය

(i) විදුලිබල ජනනය සහ සෘජු පිරිවැය (බෙදාහැරීම සහ සම්ප්‍රේෂණය හැර)

මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වනුයේ රටට අඩු පිරිවැයට විදුලිය සැපයීම වුවද, තාප විදුලිය ජනනයට දරන අධික පිරිවැය, සුළං හා අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ අඩු දායකත්වය සහ මණ්ඩලයේ අඛණ්ඩ පාඩු පියවා ගැනීම සඳහා මෑතකදී පනවන ලද විදුලි ගාස්තු සංශෝධන හේතුවෙන් එම අරමුණ ඉටුකර ගැනීමට මණ්ඩලයට නොහැකි විය.

තවද, මණ්ඩලයේ දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්මේ සහ සම්ප්‍රේෂණ සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලය හදිසි විදුලි මිලදී ගැනීම් සිදු කර තිබූ අතර එය මණ්ඩලයේ අවම පිරිවැය අරමුණට බලපා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී මුළු විදුලිබල ජනනයෙන් සියයට 46.5 ක් තාප විදුලිබල ප්‍රභවයන්ගෙන් ජනනය කර තිබුණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී විදුලි ජනන තත්ත්වය පහත දැක්වේ.

| මූලාශ්‍රය | 2024 | 2023 | වැඩි වීම/(අඩු වීම) | |
|---|---|---|---|---|
| | ගි.වො.පැය | ගි.වො.පැය | ගි.වො.පැය | % |
| **ලංකා විදුලිබල මණ්ඩලය** | | | | |
| ජලවිදුලිය | 5,426 | 4,573 | 853 | 18.7 |
| තාප | 1,568 | 1,972 | (404) | (20.5) |
| ගල් අඟුරු | 5,482 | 4,646 | 836 | 18.0 |
| සුළං | 383 | 391 | (8) | (2.0) |
| කුඩා දූපත් | 2.8 | 2.7 | 0.1 | 3.7 |
| **උප එකතුව** | **12,861** | **11,585** | **1,276** | **11.0** |
| **ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්** | | | | |
| ජලවිදුලිය | 1,473 | 1,378 | 95 | 6.9 |
| තාප | 768 | 1,160 | (392) | (33.8) |
| සුළං | 409 | 427 | (18) | (4.2) |
| අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති | 167 | 167 | - | - |
| ග්‍රිඩ් සම්බන්ධිත සූර්ය | 257 | 227 | 30 | 13.2 |
| වහලය මත සූර්ය | 867 | 632 | 235 | 37.2 |
| **උප එකතුව** | **3,940** | **3,991** | **(51)** | **(1.3)** |
| **මුළු එකතුව** | **16,802** | **15,576** | **1,226** | **7.9** |

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී තාප සහ සුළං ප්‍රභවයන් හැර අනෙකුත් සියලුම ප්‍රභවයන්ගෙන් විදුලිබල ජනනය වැඩි වී තිබුණි. තවද, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී සූර්ය, ජල සහ ගල් අඟුරුවලින් විදුලිබල ජනනය පිළිවෙලින් සියයට 30.85 කින් සහ සියයට 15.93 කින් සහ සියයට 18 කින් වැඩි වී තිබුණි.

(ii) **සෘජු පිරිවැය**

පසුගිය වර්ෂය හා සසඳන විට **2024** වර්ෂයේ සෘජු පිරිවැයෙහි පිරිවැය අනුව විශ්ලේෂණයක් පහත දැක්වේ.

| විස්තරය | 2024<br>රු. මිලියන | 2023<br>රු. මිලියන | වැඩි වීම/(අඩු වීම)<br>ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| ඉන්ධන | 81,899 | 120,961 | (32.29) |
| ගල් අඟුරු | 108,295 | 158,208 | (31.55) |
| බලශක්ති මිලදී ගැනීම | 112,206 | 128,004 | (12.34) |
| මෙහෙයුම් සහ නඩත්තුව | 95,545 | 65,131 | 46.69 |
| ක්ෂය වීම | 36,351 | 34,662 | 3.59 |
| **සෘජු පිරිවැය** | **434,296** | **506,966** | **(14.40)** |

ඉහත තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන සහ ගල් අඟුරු මිල අඩුවීම හේතුවෙන්, ඉන්ධන සහ ගල් අඟුරු පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 32.29 කින් සහ සියයට 31.55 කින් අඩු වී ඇති බව අනාවරණය විය. තවද, සමාලෝචිත වර්ෂය තුළදී මෙහෙයුම් සහ නඩත්තු වියදම් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 46.69 කින් සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි.

**3.2 අනාර්ථික ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය සඳහා යෝජිත මුලස්ථාන ගොඩනැගිල්ලේ පයිලින් වැඩ සඳහා කොන්ත්‍රාත්තුව 2012 මාර්තු 12 වන දින ප්‍රදානය කර තිබූ අතර ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 02 වන දින රු. මිලියන 4,774.6 ක කොන්ත්‍රාත් මුදලකට ප්‍රදානය කර තිබුණි. එය 2023 අගෝස්තු 15 වන දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, 2023 මාර්තු 14 වන දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, 2022 දෙසැම්බර් 07 වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී විදුලිබල අමාත්‍යවරයා විසින් ලබා දෙන ලද උපදෙස් මත කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 13.2 ක් ලෙස පවතින විට 2023 අගෝස්තු 15 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. | කොවිඩ්-19 වසංගතය සහ රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවලට බරපතල ලෙස බලපෑ ඇත. දුෂ්කරතාවන් සලකා බලමින්, 2023 පෙබරවාරි 14 වන දින මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය ආරක්ෂණ කටයුතු සහිතව පළමු මහල මට්ටම අවසන් කිරීමෙන් පසු ව්‍යුහාත්මක කටයුතු ඉදිකිරීම් අවසන් කිරීමට සහ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා ගිවිසුම්ගත ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. අඩු කළ විෂය පථය සැලකිය යුතු ලෙස නිම කිරීමේ දිනය 2023 අගෝස්තු 15 වන දින විය. එම දිනයේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 13.9 ක් විය. මේ අතරතුර, රු. මිලියන 467 ක අත්තිකාරම් ගෙවීම සම්පූර්ණයෙන්ම | ගොඩනැගිල්ල ආර්ථික වශයෙන් භාවිතා කළ හැකි වන පරිදි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

කොන්ත්‍රාත්තුව සැලකිය යුතු ලෙස නිම කිරීමෙන් පසු, පළමු මහලේ ස්ලැබ්, රැම්ප් සහ සම්ප් ප්‍රදේශවල හඳුනාගත් අඩුපාඩු 2025 පෙබරවාරි 08 වන දින හෝ ඊට පෙර සම්පූර්ණ කළ යුතු බව ඉංජිනේරුවරයා කොන්ත්‍රාත්කරුට දන්වා තිබුණි. අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු මුළුමනින්ම වගකිව යුතු වුවද, 2025 අගෝස්තු 31 වන විටත් එම අඩුපාඩු අයිතම සම්පූර්ණ කිරීමට ඔහු අපොහොසත් වී තිබුණි. 2023 අගෝස්තු 15 වන දින සිට ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන වියදම් (වැටුප්, ඉන්ධන, වාහන අලුත්වැඩියාවන් යනාදිය) සඳහා රු. මිලියන 11.5 ක මුදලක් වැය කර තිබුණි. 2021 දී ආරම්භ කරන ලද ඉදිකිරීම් කටයුතුවලින් පළමු මහලේ කටයුතු පමණක් මේ දක්වා අවසන් කර තබූ බැවින්, එය එහි අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කිරීමට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2025 ජුනි 30 වන දිනට මෙම ඉදිකිරීම් කටයුතු සඳහා වැය කරන ලද රු. මිලියන 1,503 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට අක්‍රියව පැවතුණි.

අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොගත් රු. මිලියන 330 ක අත්තිකාරම් ගෙවීම අහිමි කිරීමට ලංවිම 2024 දෙසැම්බර් 04 වන දින පියවර ගන්නා ලදි. අඩු කරන ලද විෂය පථයේ ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරු එකතුව රු. බිලියන 1.9 ක හිමිකම් පෑමක් ඉදිරිපත් කර තිබූ අතර, ඒවා දැනට ආරවුල් විනිශ්චය මණ්ඩලයේ ඇගයීම යටතේ පවතී. අඩුපාඩු නිවැරදි කිරීම සහ ව්‍යුහයේ ආරක්ෂක කටයුතු ස්ථාපනය කිරීම හැර වෙනත් ප්‍රධාන ඉදිකිරීම් කටයුතු නොතිබුණි. කෙසේ වෙතත්, නිවැරදි කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම, නැවත ආරම්භ කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ ආරවුල් විනිශ්චය කිරීමේ ක්‍රියා පටිපාටියට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපෘතියකළමනාකරණ ඒකකය ක්‍රියාත්මක වේ. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව, භාරගැනීමේ සහතිකය නිකුත් කිරීමෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සහ NCB ක්‍රියාපටිපාටිය හරහා ඉතිරි වැඩ ඉදිකිරීම සඳහා නැවත ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත් අනුමැතිය ලබා දෙන ලදි. ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නැවත ආරම්භ කිරීම සඳහා ලංවිම අරමුදල් භාවිතා කිරීමට (රු. බිලියන 11.5) සහ පවතින උපදේශන සේවා කොන්ත්‍රාත්තුව (රු. මිලියන 74) දිගටම කරගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදි. මෙම කාරණය සම්බන්ධයෙන් නව සංදේශයක් ඉදිරිපත් කිරීමට අදහස් කරන බැවින්, ගරු අමාත්‍යතුමා විසින් 2025-07-08 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ඉල්ලා අස්කර ගත් බව දන්වන ලදි. ඒ අනුව නැවත ටෙන්ඩර් කිරීමේ තීරණය ලැබීමට නියමිත වේ. 2025-09-15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවායෝජකයා ව්‍යාපෘතිය භාර ගන්නා බව ව්‍යාපෘතියඋපදේශකවරයා කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. භාරදීම සිදුකරමින් පවතී.

| | | | |
|---|---|---|---|
| (ආ) | මණ්ඩලය සඳහා ඒකාබද්ධ ව්‍යාපාර සම්පත් සැලසුම්කරණයක් (ERP) සංවර්ධනය කිරීම සඳහා උපදේශන සේවා කොන්ත්‍රාත්තුව 2017 මැයි 17 වන දින KPMG සමාගමට රු. මිලියන 164.93 ක කොන්ත්‍රාත් මුදලකට ප්‍රදානය කර තිබූ අතර සේවකයින් 1800 ක් සඳහා වැඩමුළු 80 ක් පවත්වා තිබුණි. කෙසේ වෙතත්, අරමුදල් දුෂ්කරතා හේතුවෙන් ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබූ අතර මණ්ඩලයට අපේක්ෂිත ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඉහත උපදේශන සේවා ව්‍යාපෘතිය සඳහා දරන ලද රු. මිලියන 155.38 ක මුදලක් අනාර්ථික වී තිබුණි. | 2022 දී දෙවන ලංසු තැබීමේ ක්‍රියාවලිය සිදුකරමින් පවතින අතරතුර, ශ්‍රී ලංකාව සහ ලංවිම ආර්ථික අර්බුදයකට මුහුණ දුන් අතර, මේ හේතුවෙන් බොහෝ ලංසුකරුවන් ටෙන්ඩරය සඳහා උනන්දුවක් නොදැක්විය. තවද, 2022 දී රට බංකොලොත් බව ප්‍රකාශ කළ අතර, රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් ණය මුදලක් හරහා ERP ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයීමට නොහැකි බව ආසියානු සංවර්ධන බැංකුව දැනුම් දී ඇත. ඒ අනුව, ලංවිම පාලනයෙන් ඔබ්බට ගිය හේතූන් මත ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදි. ERP ව්‍යාපෘතියේ 01 වන අදියර සඳහා දැනටමත් සිදු කර ඇති රු. 122,769,567.01 ක ආයෝජනය විචක්ෂණශීලී ආයෝජනයක් වේ. | ● ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර අරමුදල් ලබා ගැනීමේ හැකියාව සහතික කිරීමට කටයුතු කළ යුතුය.<br>● ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට සහ මණ්ඩලයේ දෛනික කටයුතු සඳහා එය භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 දී මණ්ඩලයේ ප්‍රධාන ජනන සැලැස්මේ හඳුනාගත් සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. මුලින් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් කළමනාකරණය කරන ලද අතර, මූලික වියදම් සඳහා රු. මිලියන 1.3 ක් වැය කිරීමෙන් පසුව එය මණ්ඩලයට මාරු කර තිබුණි. 2021 සැප්තැම්බර් 30 වන විට, මණ්ඩලය මූලික කටයුතු සඳහා රු. මිලියන 301.19 ක් වියදම් කර තිබුණද, අවසානයේ ව්‍යාපෘතිය අවසන් කර මෙගාවොට් 7 ක කුඩා ජල විදුලි බලාගාර දෙකක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට නැවත පැවරීමට තීරණය කර තිබුණි. මණ්ඩලයේ වියදම් අනාර්ථික වීමට මෙම තීරණය හේතු වූ අතර, මෙම වියදම් අයකර ගැනීමට හෝ ඒවා නිසි ලෙස ගිණුම්ගත කිරීමට කිසිදු උත්සාහයක් ගෙන නොතිබුණි. | අතිරේක සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති) විසින් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිකාවක් ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය තවමත් ලැබීමට නියමිතය. | මණ්ඩලයේ අරමුදල් ශක්‍ය කටයුතු සඳහා භාවිතා කරන බවට සහතික කිරීම. |

### 3.3 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ප්‍රභවයන් වෙතින් විදුලිබලය මිලදී ගැනීම් මත ප්‍රමාද පොලිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන | මොරගහකන්ද ජලාශයේ සුළු ජලවිදුලි බලාගාර අදියර I, II, III සහ අනෙකුත් NCRE සංවර්ධකයින් කිහිප දෙනෙකු සඳහා නියමිත දිනට | ණය පැහැර හැරීමේ පොලිය ඇතිවීම වැළැක්වීම සඳහා විදුලිය මිලදී ගැනීම් |

| | | | |
|---|---|---|---|
| | 787.87 ක මුදලක් දරා තිබුණි. | හෝ ඊට පෙර ගෙවා නොමැති ඉන්වොයිසි සඳහා ගෙවිය යුතු ප්‍රමාද පොලිය නියෝජනය කරයි. | සඳහා නියමිත වේලාවට ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාද වූ කොන්ත්‍රාත් ගෙවීම් සඳහා ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ සහ හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමාද ගාස්තු ලෙස මණ්ඩලය විසින් පිළිවෙලින් රු. මිලියන 358.55 ක් සහ රු. මිලියන 109.93 ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියකටයුතුවල ප්‍රගතියට බාධාවක් වූ මෙම ප්‍රමාදයට කොවිඩ් 19 වසංගතය සහ පශ්චාත් මූල්‍ය අර්බුදය හේතු විය. එබැවින්, කොන්ත්‍රාත්තුවල නියමයන් සහ කොන්දේසි අනුව උපචිත ප්‍රමාද වූ ගෙවීම් නොවැළැක්විය හැකිය. | ප්‍රමාද ගාස්තු වැළැක්වීම සඳහා කොන්ත්‍රාත්කරුට නියමිත වේලාවට ගෙවීම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය හැකි විය යුතුය. 2022 - 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2022 වර්ෂයේදී මෙගාවොට් 544 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එකතු කිරීම සැළසුම් කර තිබූ නමුත් මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. තවද, 2023–2042 සඳහා අනුමත කරන ලද අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2023 දී මෙගාවොට් 607 ක් සහ 2024 දී මෙගාවොට් 1094 ක් වශයෙන් මෙගාවොට් 1,701 ක මුළු ධාරිතාවකින් යුත් බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට මෙගාවොට් 1,052 ක බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී රු. බිලියන 1.72 ක් වටිනා ගිගාවොට් පැය 24.93 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණු අතර සමස්ත ඒකකයක සාමාන්‍ය පිරිවැය රු.19.71 ක් වන විට මිලදී ගත් අමතර විදුලිබල ඒකකයක සාමාන්‍ය පිරිවැය රු.68.97 ක් විය. | ආර්ථික පසුබෑම 2021 සිට 2024 දක්වා කාලය තුළ විදුලි ඉල්ලුමේ සැලකිය යුතු හැකිලීමකට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ආර්ථික අර්බුදයට පෙර සකස් කරන ලද LTGEP 2023–2042, ආර්ථික අර්බුදයෙන් පසු විදුලි ඉල්ලුම හැකිලීමට පෙර පුරෝකථනය කරන ලද ධාරිතා අවශ්‍යතාවය පිළිබිඹු කරයි. මෙම වෙනස හඳුනා ගනිමින්, නවතම අනුමත LTGEP 2025-2044 මගින් අඩු වූ විදුලි ඉල්ලුම ඇතුළුව ආර්ථික අර්බුදයේ බලපෑම් ඇතුළත් කර ඇත. මෙය විකාසනය වන ජාතික තත්වයන්ට අනුකූලව සැලසුම් උපකල්පන අඛණ්ඩව යාවත්කාලීන කිරීමේ වැදගත්කම ඉස්මතු කරයි.<br>2024 සහ 2025 වර්ෂවලදී LTGEP 2023-2042 මගින් අපේක්ෂිත සූර්ය බලශක්ති උත්පාදනට වඩා තථ්‍ය සූර්ය බලශක්ති උත්පාදනය ඉහළ ගොස් ඇත.<br>මොරගොල්ල බලාගාරය 2025 දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර සෝබධනව් බලාගාරයේ විවෘත චක්‍රීය මෙහෙයුම් 2023 සඳහා සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, එය අවසානයේ 2024 දී ක්‍රියාත්මක | දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරන ලදි. 2024 දී අපේක්ෂා කළ ඒකාබද්ධ චක්‍රීය මෙහෙයුම් දැනට ක්‍රියාත්මක කිරීම සහ පරීක්ෂා කිරීම සිදුකරමින් පවතී. තවද, ඉහත සඳහන් කළ පරිදි ඉල්ලුම අඩුවීම හේතුවෙන් කැලණිතිස්ස හි මෙගාවොට් 350 ක දෙවන ඒකාබද්ධ චක්‍රීය බලාගාරයේ සහ මෙගාවොට් 130 ක ගෑස් ටර්බයින බලාගාරයේ අවශ්‍යතාවය LTGEP 2025-2044 හි කල් දමා ඇත. | |
| (ආ) | ලද තොරතුරුවලට අනුව, වර්ෂයකට මුළු පද්ධති හානි මාසික සාමාන්‍ය ශුද්ධ විදුලි උත්පාදනයට ඉතා ආසන්න හෝ ඊට වැඩි බව නිරීක්ෂණය විය. (මුළු පද්ධති හානිය 2024 සඳහා ගිගාවොට් පැය 1,406 ක් සහ 2023 සඳහා ගිගාවොට් පැය 1,379 ක් විය.). 2023 ඔක්තෝබර් 20 සහ 2024 මාර්තු 05 දින සිට බලාත්මක කරන ලද විදුලි ගාස්තු සංශෝධනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් අනුමැතිය ලබා දෙන අවස්ථාවේ දී පනවන ලද කොන්දේසි යටතේ ඉදිරි වර්ෂ පහ තුළදී සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ හානි අඩු කිරීම සඳහා සැලැස්මක් ඉදිරිපත් කිරීමට නියෝගයක් ලබා දී තිබූ අතර, එම අරමුණ සඳහා වන සැලසුම් මණ්ඩලයේ දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්මට සහ මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීමේ සංවර්ධන සැලසුම්වලට ඇතුළත් කර ඇති බව මණ්ඩලය විසින් ප්‍රකාශ කර තිබුණි. 2018-2027 දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්මට අනුව, 2018 සිට 2025 දක්වා යෝජනා 188 ක් හඳුනාගෙන තිබුණි. මුළු යෝජනා අතරින්, යෝජනා 37 ක් සහ යෝජනා 36 ක් පිළිවෙලින් නියමිත වේලාවට සහ ප්‍රමාදයකින් යුතුව අවසන් කර තිබුණි. තවත් යෝජනා 09 ක් ප්‍රමාද වී ආරම්භ කර තිබූ අතර යෝජනා 69 ක් 2025 ජුනි 30 වන දින දක්වාම ආරම්භ කර නොතිබුණි. | වසංගතය සහ රට තුළ ඇති වූ ආර්ථික අවපාතය හේතුවෙන්, අපේක්ෂිත ලෝඩ් වර්ධනය සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූ අතර වර්තමානයේ පාරිභෝගික ඉල්ලුම 2018-2027 දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්මේ අපේක්ෂිත මට්ටමට සාපේක්ෂව වසර 4 ක් පමණ පසුගාමී වේ. එබැවින්, යෝජිත සම්ප්‍රේෂණ සංවර්ධන අවශ්‍යතා නැවත සලකා බලන ලද අතර ඒ අනුව නිම කිරීමේ වර්ෂ යාවත්කාලීන කරන ලදි.<br><br>සම්ප්‍රේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී, වැඩ බිම් අත්පත් කර ගැනීමේ ගැටළු, ටෙන්ඩර් කිරීමේ ගැටළු, බාධා කිරීම්වලට ඉඩ දීම, අරමුදල් හිඟය, ස්වාභාවික විපත්, වසංගත ගැටළු සහ අධිකරණ නඩු ආදිය හේතුවෙන් ප්‍රමාදයන් සිදු වේ. | දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්මේ නියමිත දින වකවානු තුළ සම්ප්‍රේෂණ ව්‍යාපෘතියනිම කිරීම සඳහා ඒවායේ ප්‍රගතිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත (සංශෝධිත) 2024 ජුනි 27 දින සහතික කරන ලද අතර 1, 2, 3, 4, 9 වන වගන්ති, 10 වගන්තියේ (1) උපවගන්තිය, 10 වගන්තියේ (2) උපවගන්තියේ (ආ) වගන්තිය, 10 වගන්තියේ (3) උපවගන්තිය, 10 වගන්තියේ (5) උපවගන්තිය, 14 වන වගන්තිය, 15 වන වගන්තිය, 17 වන වගන්තිය, 18 වන වගන්තිය, 38 වන වගන්තිය සහ 39 වන වගන්තිය පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් | මෙම 4 වන වගන්තියට අනුව, මෙය අමාත්‍යවරයාගේ සහ සභාවේ වගකීමකි.<br><br>මෙම 18 වන වගන්තියට අනුව, මෙය ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයේ (PSRS) වගකීමකි. | 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ (සංශෝධිත) දක්වා ඇති විධිවිධාන පිළිපැදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බවට පත්වන දින සිට ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, 2025 නොවැම්බර් 30 වන දින වන විටත් මණ්ඩලය විසින් 04, 18 සහ 39 වන වගන්තිවල දක්වා ඇති විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි. | PSRS විසින් ඉල්ලා සිටින පරිදි ලංකා විදුලිබල මණ්ඩලය විසින් සියලුම විස්තර ඉදිරිපත් කර ඇත. තවද PSRS එකඟ වූ පරිදි එම දත්ත දත්ත කාමරයකදී PSRS වෙත උඩුගත කර ලබා දී ඇත. | |
| (ඇ) | මණ්ඩලය සහ වෙස්ට් කෝස්ට් පවර් ප්‍රයිවට් ලිමිටඩ් අතර විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ (PPA) 09 වන උපලේඛනයේ ඇමුණුම ඒ හි 2 වන වගන්තියට අනුව, ගිවිසුම් කාලපරිච්ඡේදයේ පළමු වර්ෂය අවසානයේ බලාගාරයේ තථ්‍ය කාර්ය සාධනය මත පදනම්ව ඒකාබද්ධ චක්‍රීය අගයන් පිළිබඳ දෙපාර්ශවයම විසින් එකඟතාවයකට පැමිණිය යුතුය. කෙසේ වෙතත්, බලාගාරයේ ඒකාබද්ධ චක්‍රීය මෙහෙයුම් දිනය 2010 මැයි 10 දිනය වුවත් 2024 අගෝස්තු 12 වන දින දක්වාම දෙපාර්ශවයම එවැනි එකඟතාවයකට පැමිණ නොතිබුණි. (දෙපාර්ශවයම විසින් 2024 අගෝස්තු 12 වන දින සමහර පරාමිතීන් සඳහා වන අගයන් අඩු කිරීමට එකඟ විය). එබැවින්, 2024 අගෝස්තු 12 වන දින දක්වා බලාගාරයේ තථ්‍ය කාර්ය සාධනය මත පදනම්ව සමහර පරාමිතීන් සඳහා අගයන් අඩු කිරීමට දෙපාර්ශවයම එකඟතාවයකට පැමිණ නොතිබූ බැවින්, ගිවිසුම් කාලපරිච්ඡේදයේ පළමු වර්ෂය අවසානයේ (2011 මැයි 10) සිට ලංවිම වෙත කිසියම් වාසිදායක ගැලපීමක් ලබා ගැනීමේ අවස්ථාව ලංවිම වෙත අහිමි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 ජනවාරි දක්වා බලශක්ති ගාස්තු, පණගැන්වීමේ ගාස්තු සහ ප්‍රමාද වූ පොලිය සඳහා ලංවිමට වැඩි මුදලක් ගෙවීමට සිදුවිය. තවද, 2019 පෙබරවාරි 15 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 2019 පෙබරවාරි 15 වන දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් අතරමැදි විසඳුමක් ලෙස සමහර පරාමිතීන් සඳහා අඩු කළ අගයන් මත පදනම්ව ඒකාබද්ධ චක්‍රීය මෙහෙයුම් දිනය වූ 2010 මැයි 10 වන දින සිට මේ දක්වා සමාගමට වැඩිපුර ගෙවා ඇති තථ්‍ය මුදල (ඇස්තමේන්තුගත මුදල රු. බිලියන 8.6 කි.) ගණනය කරන ලෙස සහ ප්‍රමාද වූ පොලී ගාස්තු සමඟ ඒවා අයකර ගැනීමට කඩිනම් පියවර ගන්නා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි වෙත උපදෙස් දී තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් තථ්‍ය වැඩිපුර ගෙවීම ගණනය කිරීමට සහ ප්‍රමාද වූ පොලිය සමඟ එය අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ලංවිම අපොහොසත් වී තිබුණි. | ලංවිම සහ වෙස්ට් කෝස්ට් පවර් ප්‍රයිවට් ලිමිටඩ් (WCPL) හි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව 2024 සැප්තැම්බර් මාසයේ සිට යුගදනවි බලාගාරයේ මෙහෙයුම් වෙනුවෙන් ඉන්වොයිසි සකස් කිරීමේදී දෙපාර්ශවයම අලුතින් එකඟ වූ පරාමිතීන් භාවිතා කර ඇත.<br>යුගදනවි බලාගාරයේ ඒකාබද්ධ චක්‍රීය මෙහෙයුම් ආරම්භයේ සිට එකඟ වූ පරාමිති ක්‍රියාත්මක කිරීමට නම්, ප්‍රධාන ඉන්වොයිස් අගයන් මෙන්ම එයට ගෙවිය යුතු පොලිය 2010 මැයි මාසයේ සිට ගණනය කළ යුතුය. ගණනය කිරීම් සමස්ත ඒකාබද්ධ චක්‍රීය මෙහෙයුම් කාලපරිච්ඡේදය සඳහා සිදු කරනු බැවින්, පරාමිති වෙනස් වීමෙන් ලංවිම වෙත අපේක්ෂිත ප්‍රතිලාභය එය තුළ ගණනය කරනු ඇත. එම ගණනය කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් ඇත. එම ක්‍රියාවලිය සම්පූර්ණ කර දෙපාර්ශවයම එකඟ වූ පසු, අවසාන ගණනය කිරීම් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත.<br>පාර්ශව දෙකම අවසාන ගණනය කිරීම් සිදු කළ පසු, ලංවිම හි ගෙවිය යුතු ශේෂය සහ WCPL හි ලැබිය යුතු ශේෂය සමාන වනු ඇත. | • අනාගතයේදී ආරවුල් වළක්වා ගැනීම සඳහා බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම්වල විධිවිධාන අනුගමනය කරන බවට සහතික කිරීමට කටයුතු කළ යුතුය.<br>• ප්‍රමාද වූ පොලිය සමඟ වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 අංක 16 දරන විදුලිබල (සංශෝධන) පනතට අනුව, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා විදුලිය නිපදවීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත නව ජනන බලාගාරයක් සම්බන්ධයෙන් හෝ වැඩිදියුණු කරනු ලබන හෝ වැඩිදියුණු කරනු ලැබිය යුතු යම් පවතින ජනන බලාගාරයක් පුළුල් කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද දැන්වීමක් මත ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අදාළ නොවේ. ඒ අනුව, 2022 ජුනි 28 සිට 2024 දෙසැම්බර් 02 දක්වා කාලය තුළදී SLSEA වෙතින් ලද එකතුව මෙගාවොට් 2,115.4 ක ධාරිතාවක් සහිත ව්‍යාපෘතියඅතරින්, 2024 දෙසැම්බර් 31 දක්වා එකතුව මෙගාවොට් 762.6 ක ධාරිතාවක් සහිත ව්‍යාපෘතියසඳහා පමණක් අභිප්‍රාය ලිපි නිකුත් කර තිබූ අතර එකතුව මෙගාවොට් 467.5 ක ධාරිතාවක් සහිත ව්‍යාපෘතියසඳහා පමණක් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර තිබුණි. කෙසේවෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 23.6 ක ධාරිතාවයක් සහිත බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | ඒවායින් සමහරක් ආරම්භක අදියරේ පැවති අතර, එම ව්‍යාපෘතියලංවිම ජාලයට (network) සම්බන්ධ කළ හැකිද යන්න තීරණය කිරීම සඳහා ලංවිම වෙතින් ජාල සම්බන්ධතා එකඟතාව (grid concurrence) ඉල්ලා ඇත.<br><br>2022–2024 කාලය තුළදී NCRE ව්‍යාපෘතියක්‍රියාත්මක නොවීමට හේතු පහත දැක්වේ.<br><br>(අ) සුළු ජලවිදුලි බලාගාර සංවර්ධනයේ අඩු ප්‍රගතිය<br>(ආ) ජාල ධාරිතාව නොමැතිකම<br>(ඇ) ඉඩම් ගැටළු | පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා විදුලිය නිපදවීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත යම් නව ජනන බලාගාරයක් ක්‍රියාත්මක කිරීම හෝ වැඩිදියුණු කරනු ලබන හෝ වැඩිදියුණු කරනු ලැබිය යුතු යම් පවතින ජනන බලාගාරයක් පුළුල් කිරීම සම්බන්ධ ගැටළු විසඳීමට වහාම කටයුතු කළ යුතුය. |
| (ඊ) | මූලස්ථානයේ, වත්කම් කළමනාකරණ අංශයේ සහ බෙදාහැරීමේ අංශය **2** හි රු. මිලියන 96,929.08 ක ධාරණ වටිනාකමක් ඇති ස්ථාවර වත්කම් සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා (BOS) විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | BOS වාර්තා ඉදිරිපත් කරන ලෙස අදාළ අංශ දැනුවත් කිරීමට පියවර ගනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සමඟ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2024 දෙසැම්බර් 31 වන දිනට බෙදාහැරීමේ අංශ හතරෙහි, ජනන අංශයේ සහ වත්කම් කළමනාකරණ අංශයේ එකතුව රු. මිලියන 3,890 ක් වූ පරිභෝජ්‍ය තොග, අපහරණය කිරීමට හෝ අවශ්‍යතා ඇති අංශවලට මාරු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල සෙමින් චලනය වන, චලනය නොවන, යල් පැන ගිය සහ හානි වූ තොග ලෙස දක්වා තිබුණි. | **බෙදාහැරීමේ අංශය - 01**<br>අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සකස් කරමින් පැවතීම හෝ සමහර අවස්ථා සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.<br>**බෙදාහැරීමේ අංශය 02**<br>සෙමින් චලනය වන, චලනය නොවන, යල් පැන ගිය සහ හානි වූ තොග සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා එක් එක් පළාත් විසින් ඉදිරිපත් කර ඇත. අපහරණය කිරීමේ ක්‍රියාවලිය ලංවිම හි ක්‍රියා පටිපාටිවලට අනුව සිදු කරමින් ඇත.<br><br>කලාප කිහිපයක් සඳහා (මඩකලපුව සහ P&HM) අනුමැතිය ලැබීමට නියමිතය. | යල් පැන ගිය, මන්දගාමී, චලනය නොවන සහ හානි වූ තොග ප්‍රමාදයකින් තොරව තක්සේරු කර බැහැර කිරීමට හෝ මාරු කිරීමට පියවර ගත යුතුය. |

**බෙදාහැරීමේ අංශය - 03**

සියළුම පළාත් අපහරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

**බෙදාහැරීමේ අංශය 04**

- බස්නාහිර පළාත දකුණ 1 – 2023 ශේෂයන් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා පිළියෙළ කර ක්‍රියාමාර්ග ගෙන ඇත. 2024 ශේෂයන් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය.

- දකුණු පළාත 2 – භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අතිරේක සාමාන්‍යාධිකාරි වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. ඉන් පසුව, අපහරණය කිරීමේ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය.

**ජනන අංශය**

**ලක්විජය බලාගාරය** – භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අතිරේක සාමාන්‍යාධිකාරි (ජනන) වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත.

**මහවැලි සංකීර්ණය** – අභ්‍යන්තර විගණන නිරීක්ෂකයෙකු සමඟ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි

**සමනල සංකීර්ණය** – වාර්තා සහතික කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකට ඉදිරිපත් කර ඇත. සහතික කිරීමෙන් පසු අපහරණය කිරීම සිදු කරනු ඇත.

**සම්ප්‍රේෂණ සහ LC අංශ:**

යල් පැන ගිය සහ හානි වූ තොග අපහරණය කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

| | | | |
|---|---|---|---|
| (ඖ) | 2023 ඔක්තෝබර් 30 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් සංශෝධනය කරන ලද පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුව (අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/2066/621/092) විදුලිබල ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම ආශ්‍රිත පිරිවැය වඩා හොඳින් පිළිබිඹු කිරීම සඳහා ද්විවාර්ෂික විදුලි ගාස්තු සංශෝධන කාල සීමාව කාර්තුමය පදනමකට වෙනස් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 වර්ෂය තුළදී විදුලි ගාස්තු සංශෝධන දෙකක් පමණක් ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරන ලදි. | | |
| (i) | 2024 මාර්තු සහ ජූලි මාසවල විදුලි ගාස්තු සංශෝධන ලෙස විදුලි ගාස්තුව පිළිවෙලින් සියයට 3.34 කින් සහ සියයට 4.63 කින් පමණක් අඩු කිරීම සඳහා මණ්ඩලය විසින් යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, යෝජනාවට ඇතුළත් ඇස්තමේන්තු දෝෂ නිවැරදි කිරීමෙන් පසු, 2024 මාර්තු සහ ජූලි මාසවලදී විදුලි ගාස්තුව පිළිවෙලින් සියයට 21.93 කින් සහ සියයට 22.49 කින් සැලකිය යුතු ලෙස අඩු කිරීම සඳහා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. එවැනි සැලකිය යුතු අඩු කිරීමක් තිබියදීත්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 වර්ෂය සඳහා රු. මිලියන 162,620 ක කැපී පෙනෙන මෙහෙයුම් ලාභයක් (මූල්‍ය පිරිවැයට පෙර) සහ රු. මිලියන 144,394 ක කැපී පෙනෙන ශුද්ධ ලාභයක් උපයා තිබුණි. ඒ හා සමානව, 2025 පළමු භාගය සඳහා සහ 2025 ජූනි සිට දෙසැම්බර් දක්වා විදුලි ගාස්තු සංශෝධන ලෙස පිළිවෙලින් පවතින විදුලි ගාස්තු පවත්වා ගැනීමට සහ සියයට 18.3 කින් විදුලි ගාස්තු වැඩි කිරීමට මණ්ඩලය විසින් යෝජනා කර තිබුණි. කෙසේ වෙතත්, යෝජනාවේ ඇතුළත් ඇස්තමේන්තු දෝෂ නිවැරදි කිරීමෙන් පසු, 2025 පළමු භාගය සඳහා විදුලි ගාස්තු සියයට 20.08 කින් අඩු කිරීමට සහ 2025 ජූනි සිට දෙසැම්බර් දක්වා විදුලි ගාස්තු සියයට 15 කින් වැඩි කිරීමට මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. 2024 ජනවාරි සිට ජූනි දක්වා මණ්ඩලය විසින් උපයා ගත් ආදායමෙන් 2025 මුල් මාස 6 සඳහා රු. මිලියන 51,098 ක් දක්වා අලාභයක් පියවීමට යටත්ව 2025 මුල් මාස 6 සඳහා විදුලි ගාස්තු සියයට 20.08 කින් අඩු කිරීමට මහජන උපයෝගීතා කොමිෂන් සභාව සලකා බැලුවද, මණ්ඩලය විසින් පිළියෙල කරන ලද අතුරු මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2025 මුල් | ජල විදුලි උත්පාදනයේ මෙම සුවිශේෂී වැඩිවීම තාප උත්පාදනය මත යැපීම සැලකිය යුතු ලෙස අඩු කළ අතර, එමගින් තථ්‍ය උත්පාදන පිරිවැය, විදුලිගාස්තු සකස් කිරීමේදී භාවිතා කරන පුරෝකථනය කරන ලද පිරිවැය මට්ටම්වලට වඩා බෙහෙවින් අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වර්ෂයේ තථ්‍ය මූල්‍ය ප්‍රතිඵල, විදුලි ගාස්තු යෝජනාවේ ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා ඉහළ මෙහෙයුම් සහ ශුද්ධ ලාභයක් පිළිබිඹු කරන ලදි. 2024 දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ මූල්‍ය කාර්ය සාධනය, විදුලි ගාස්තු යෝජනා සකස් කිරීමේ ක්‍රියාවලියේ කිසියම් පක්ෂග්‍රාහීත්වයක් හෝ සාධාරණත්වයක් නොමැතිකමක ඇඟවීමක් නොව, අනපේක්ෂිත ජල විද්‍යාත්මක තත්ත්වයන්ගේ සෘජු ප්‍රතිවිපාකයක් විය. | සාධාරණ උපකල්පන සහ ඇස්තමේන්තු මත පදනම්ව විදුලි ගාස්තු යෝජනා සකස් කර ඇති බව සහතික කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මාස 6 සඳහා රු. මිලියන 13,162 ක අලාභයක් පමණක් දරා තිබූ අතර එමඟින් එම කාලය සඳහා ගම්‍ය ලාභයක් පෙන්නුම් කෙරේ. ඒ අනුව, මණ්ඩලය විසින් 2024 සහ 2025 සඳහා වන විදුලි ගාස්තු යෝජනා නිවරදි ආකාරයකින් පිළියෙල කර නොතිබූ බවට සාක්ෂි දරයි. | | |
| (ii) | 2022, 2023, 2024 සහ 2025 වර්ෂවල විදුලි ගාස්තු සංශෝධනය සඳහා අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී PUCSL විසින් පනවන ලද කොන්දේසි අතර, විදුලිබල මණ්ඩලයේ ජනන බලාගාර සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා අතර විදුලි මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළඹීම, බෙදාහැරීමේ බලපත්‍රලාභියා සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා අතර විදුලි අලෙවි ගිවිසුමකට එළඹීම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ ඉන්ධන සැපයුම් ගිවිසුමකට එළඹීම, සියලුම සිල්ලර පාරිභෝගිකයින් සඳහා විකල්ප පෙරගෙවුම් ගාස්තුවක් යෝජනා කිරීම, අදාළ පළාත් පාලන බලධාරීන්ගෙන් හෝ මාර්ග සංවර්ධන අධිකාරියෙන් වීදි ලාම්පු පරිභෝජන පිරිවැය එකතු කිරීම, පූර්ණ ස්වාධීන විගණනයක් සිදු කිරීම, සේවක පිරිවැටුම පිළිබඳ අනුප්‍රාප්තික සැලසුම් සහතික කිරීම සහ පිරිවැය ගිණුම්කරණ ඒකකයක් ස්ථාපිත කිරීම වැනි කොන්දේසි 2025 අගෝස්තු 31 වන විටත් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය. | 2022 සිට 2025 දක්වා කාලය සඳහා විදුලි ගාස්තු අනුමත කිරීමේ තීරණවලදී PUCSL විසින් පනවන ලද කොන්දේසි ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කරන ලද නිරීක්ෂණ ලංවිම පිළිගනී. අනුප්‍රාප්ත විදුලි ගාස්තු අනුමත කිරීම්වලදී පනවා ඇති කොන්දේසි සපුරාලීම සඳහා ලංවිම සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බවත්, නියාමන සහ ආයතනික රාමුව තුළ පූර්ණ අනුකූලතාවය සහතික කිරීම සඳහා PUCSL සහ අනෙකුත් අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය දිගටම කරගෙන යන බවත් ඉදිරිපත් කෙරේ. | විදුලි ගාස්තු සඳහා අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී PUCSL විසින් පනවන ලද සියලුම කොන්දේසි නිසි ලෙස ක්‍රියාත්මක කර ඇති බවට සහතික කිරීම. |

**3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට ව්‍යාපෘතියකටයුතු, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ කොටුමා උපපොළවල් ඉදිකිරීම සඳහා රු. මිලියන 162.01 ක පිරිවැයට මිලදී ගෙන තිබූ ඉඩම් 16 ක් 2024 වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි. | අදහස් දැක්වීමක් ලබා දී නොමැත. | අපේක්ෂිත අරමුණු සඳහා නිෂ්ක්‍රීය ඉඩම් යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7 ව්‍යාපෘතියහෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද හරිත විදුලි සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන ව්‍යාපෘතිය (අදියර II) සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලදි. | | |

| | | | |
|---|---|---|---|
| (i) | පැකේජය 2 හි ලොට් බී2 යටතේ කිලෝමීටර් 25 ක පාදුක්ක - හොරණ කේ.වී 132 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 28 වන දින එ.ජ.ඩො 3,835,437 ක පිරිවැයකට ප්‍රදානය කර තිබූ අතර දින 710 කින් කාලය 4 වරක් දීර්ඝ කිරීමෙන් පසු 2024 මාර්තු 31 වන දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2024 ජනවාරි 04 වන දින සිවිල් වැඩ හා ස්ථාපන කටයුතු සියයට 70 කින් ඉවත් කිරීමෙන් සහ කොන්ත්‍රාත් මිල එ.ජ.ඩො 2,798,112 ක් ලෙස සංශෝධනය කරමින් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබූ අතර ලංවිම විසින් ඉතිරි වැඩ සම්පූර්ණ කළ යුතු විය. කෙසේ වෙතත්, ණය මුදලින් රු. මිලියන 954.98 ක වියදමින් විදේශයන්ගෙන් සපයා ගන්නා ලද පිරියත සහ අනිවාර්ය අමතර කොටස් මණ්ඩලයට භාර දී නොමැති බව නිරීක්ෂණය වූ අතර 2025 ජුනි 02 වන දිනැති විගණිත දිනය වන විටත් මණ්ඩලය විසින් ඉතිරි වැඩ ආරම්භ කර නොතිබුණි. එබැවින්, 2025 නොවැම්බර් 30 වන විටත් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය. | පාස්කු බෝම්බ ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය සහ මෙම කාලය තුළ රටේ පැවති සෘණ ආර්ථික තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රගතියට බරපතල ලෙස බලපා ඇත. ඒ අනුව, සිවිල් වැඩ සහ ස්ථාපන කටයුතුවල ඉතිරි කොටස කොන්ත්‍රාත්තුවෙන් ඉවත් කිරීමෙන් ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ව්‍යාපෘතියේ විෂය පථය අඩු කරන ලදි. නව විෂය පථය යටතේ, ව්‍යාපෘතිය 2024 ජනවාරි 19 වන දින වන විට අවසන් කරන ලදි. ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු ලංවිම විසින් සිදු කරනු ඇත. | ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | කොන්ත්‍රාත්තුවේ කොන්දේසියට පටහැනිව, 2024 සැප්තැම්බර් 05 වන දින ලබාගත් කාර්ය සාධන බැඳුම්කර අංක 003BGTEE2402141 සහ 2024 ජුනි 27 වන දින හා 2025 ජනවාරි 10 වන දින පිළිවෙලින් ලබාගත් කාර්ය සාධන බැඳුම්කර අංක 003BGTEE2401447 සහ 003BGTEE250009 ට එරෙහිව පැකේජ 8 හි ලොට් බී සඳහා (අම්බලන්ගොඩ කේ.වී 132/33 ක කොටුමා උපපොළ හා පන්නල කේ.වී 132/33 ක කොටුමා උපපොළ වැඩි දියුණු කිරීම සහ කේ.වී 132/33, 31.5 MVA ක අමතර ට්‍රාන්ස්ෆෝමර් 2ක් සැපයීම) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉන්වොයිසි 06 ක් සඳහා රු. මිලියන 225.99 ක ඉතිරි ප්‍රගති ගෙවීම කොන්ත්‍රාත්කරු වෙත සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. | ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය මුදල නිල වශයෙන් 2024 ජුනි 30 වන දින අවසන් විය. ණය මුදල අවසන් වීමට පෙර, ව්‍යාපෘතියේ ඉංජිනේරු, අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති), ADB ණය සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමේ සහ ලංවිම මත අනවශ්‍ය මූල්‍ය බර වළක්වා ගැනීමේ අරමුණින් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද වලංගු බැංකු ඇපකර මත ගෙවීම් සහතික කර නිදහස් කිරීමට අනුමත කරන ලදි. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |

## 3.8 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 මාර්තු 01 දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියෝගයට අනුව, 2006 ප්‍රසම්පාදන අත්පොතට නිකුත් කරන ලද 35 වන අතිරේකය යටතේ නියම කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමු අංක 2.14.1 ට (විවෘත තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිය, සෘජු කොන්ත්‍රාත් ක්‍රියා පටිපාටිය හෝ පුනරාවර්තන ඇණවුම් ක්‍රියා පටිපාටිය සඳහා පමණක් අදාළ වන පරිදි) සම්බන්ධ අධිකාරී සීමාවන්, 2021 සැප්තැම්බර් 24 දිනැති මුදල් අමාත්‍යාංශ ලිපිය මගින් මණ්ඩලය විසින් 2021-2023 කාලය තුළදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට සුවිශේෂී වන පරිදි වැඩි කර තිබුණි. ඒ අනුව, 2021 ඔක්තෝබර් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි මණ්ඩලය විසින් අධිකාරී සීමාවන් සංශෝධනය කර තිබුණි. වැඩි කරන ලද ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් 2023 දෙසැම්බර් වන විට කල් ඉකුත් වී තිබුණද, 2024 ජුනි 24 වන දින දක්වා 35 වන අතිරේකය සහ 2024 ජුනි 25 වන දින සිට 40 වන අතිරේකය යටතේ නියම කර ඇති ප්‍රසම්පාදන අධිකාරී සීමාවන්ට අනුකූල වීම වෙනුවට 2024 අප්‍රේල් 03 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව, වැඩි කරන ලද ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් 2024 අගෝස්තු 29 දක්වා අඛණ්ඩව අනුගමනය කර තිබුණි. අහඹු විගණන පරීක්ෂාවකට අනුව, 35 සහ 40 වන අතිරේකවල විධිවිධානවලට පටහැනිව 2024 ජනවාරි 01 සිට 2024 අගෝස්තු 29 දක්වා කාලය තුළදී බෙදාහැරීමේ අංශය 03, තොරතුරු තාක්ෂණ අංශය සහ සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘතිය අංශය විසින් රු. මිලියන 1,976.7 ක සමස්ත ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත ප්‍රසම්පාදන ආරම්භ කර තිබූ බව නිරීක්ෂණය විය. | වැඩි කරන ලද අධිකාරී සීමාවන්හි අදාළ කාල සීමාව දීර්ඝ කිරීම සඳහා විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024.02.16 දිනැති ලිපිය මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් යවා ඇත. කෙසේවෙතත්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව එය දීර්ඝ කළ නොහැකි බව සඳහන් කරමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. එබැවින්, 2024 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි 2006 ප්‍රසම්පාදන අත්පොත හි අතිරේක අංක 35 යටතේ නියම කර ඇති අධිකාරී සීමාවන් පිළිපදින ලෙස විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්වරයා ලංවිම වෙත උපදෙස් දී ඇත. 2024 අප්‍රේල් 03 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයට අනුව, ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මක වන වැඩි කරන ලද ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට අනුමැතිය ලබා දුන් අතර, එය දිගටම කරගෙන යාමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට උපදෙස් දෙන ලදි. පසුව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ආයතනයට විශේෂිත ප්‍රසම්පාදන අත්පොතක් සංවර්ධනය කිරීම සහ අතිරේක 40 අනුගමනය කිරීම පිළිබඳව ලබා දෙන ලද උපදේශයට ප්‍රතිචාර වශයෙන්, ලංවිම සභාපතිවරයා විසින් 2024 ජූලි 03 වන දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යවා ඇති අතර එමගින් කොමිෂන් සභාව විසින් ආයතනයට විශේෂිත ප්‍රසම්පාදන අත්පොතක් අනුමත කරන තෙක්, ලංවිම විසින් අනුගමනය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද | ප්‍රසම්පාදන අත්පොතෙහි සහ මාර්ගෝපදේශයෙහි දක්වා ඇති විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| | වත්මන් වැඩි කරන ලද ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් දිගටම කරගෙන යාමට අදාළ අධිකාරියෙන් තාවකාලික අනුමැතිය ඉල්ලා ඇත. කෙසේවෙතත්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ලංවිම සඳහා ආයතනයට විශේෂිත ප්‍රසම්පාදන අත්පොතක් සංවර්ධනය කිරීම සඳහා වන උපදේසය නැවත අවධාරණය කරන ලදි. 2024 අගෝස්තු 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 24.11.340 ට අනුව, ප්‍රසම්පාදන සීමාවන් සංශෝධනය කිරීම සඳහා නව චක්‍රලේඛයක් නිකුත් කරන ලදි. | |
| (ආ) ලක්විජය බලාගාරයේ (LVPP) ඒකක 01, 02 සහ 03 හි ගල් අඟුරු දහනය කිරීමේ අතුරු ඵලයක් ලෙස නිපදවන ලද පියාසර අළු (Fly Ash) විකිණීම සඳහා ප්‍රසම්පාදනය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (i) වර්ෂ 05 ක කාලයක් සඳහා පියාසර අළු විකිණීම සඳහා පසුගිය ලංසුව කැඳවා තිබූ බවත්, එම කොන්ත්‍රාත්තුව 2023 පෙබරවාරි මස අවසානයේදී කල් ඉකුත් වී තිබූ බවත් නිරීක්ෂණය විය. වර්ෂ 05 ක කාලයක් තුළදී අමුද්‍රව්‍ය වල ඇති විය හැකි මිල විචලනයන් සලකා බැලීමෙන්, අමාත්‍ය මණ්ඩල විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CATB) විසින් මෙම අවස්ථාවේදී කොන්ත්‍රාත්තුව වර්ෂ 03 ක කාලයක් සඳහා පමණක් සීමා කිරීමට යෝජනා කර තිබුණි. පසුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සහ CATB අනුමැතිය මත පදනම්ව, 2023 ජුනි 20 දිනැති අංක 23/1179/621/051 දරන අමාත්‍ය මණ්ඩල ප්‍රතිකාව හරහා විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් 2023 ජුනි සිට 2026 මැයි දක්වා වර්ෂ 03 ක කාලයක් සඳහා තෝරාගත් ලංසුකරුවන්ට පියාසර අළු විකිණීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා තිබුණි. එම අමාත්‍ය මණ්ඩල ප්‍රතිකාව සහ 2023 මැයි 09 දිනැති ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ වාර්තාව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩල | එකඟ වේ. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වෙනස් කිරීමේ තීරණ තාර්කික බව ප්‍රසම්පාදන ආයතනය සහතික කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලේකම්වරයා වෙත යොමු කරන ලද 2023 ජුනි 22 දිනැති ලිපිය සමඟ 2023 ජුලි 12 වන දින පැවති රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් සලකා බලන ලද අතර තෝරාගත් ලංසුකරුවන්ට වර්ෂ 03 ක කාලයක් වෙනුවට වර්ෂයක කාලයක් සඳහා පමණක් පියාසර අළු විකිණීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කර තිබුණි. ඒ අනුව, 2023 ජුලි 17 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර එම නිර්දේශයට එළඹීමට හේතුව (වර්ෂ තුන වර්ෂයකට අඩු කිරීම) අමාත්‍ය මණ්ඩලය තීරණයේ පැහැදිලි කර නොතිබුණි. | | |
| (ii) | පෙර ප්‍රදානය කරන ලද ටෙන්ඩරයේ තෝරාගත් ප්‍රධාන ගැනුම්කරු ගුණත්ව අංක 01 යටතේ වර්ෂයකට උපරිම මෙට්‍රික් ටොන් 299,700 ක පියාසර අළු ප්‍රමාණයක් වර්ෂ තුනක කාලයක් සඳහා මෙට්‍රික් ටොන් එකකට රු. 13,200 ක ඒකක අනුපාතයකට මිලදී ගැනීමට එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, 2023 ජුලි 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව මණ්ඩලය විසින් වර්ෂයක කාලයක් සඳහා පමණක් පියාසර අළු මිලදී ගැනීමට කොන්ත්‍රාත්තුව ගැනුම්කරුට ප්‍රදානය කර තිබූ අතර එය තවත් මාස දෙකකට දීර්ඝ කරන ලදි. එබැවින්, ලක්විජය බලාගාරයට තවත් වසර එකයි මාස 10 ක් තුළ රු. 13,200 ක ඉහළම මිලකට ගුණාත්ව අංක 01 යටතේ වන පියාසර අළු විකිණීමේ අවස්ථාව අහිමි වී තිබුණි. ඒ වෙනුවට, ගුණාත්ව අංක 01 යටතේ වන පියාසර අළු වර්ෂයකට එකතුව මෙට්‍රික් ටොන් 286,324.8 ක ප්‍රමාණයක් වර්ෂ තුනක කාලයක් සඳහා මෙට්‍රික් ටොන් එකක් රු. 8,050 සිට රු. 2,950 දක්වා වූ ඒකක අනුපාතයක් යටතේ විකිණීමට ගිවිසුම්වලට එළඹ වී තිබුණි. මෙට්‍රික් ටොන් 286,324.8 අතරින්, වර්ෂයකට මෙට්‍රික් ටොන් 208,927.2 ක බහුතර ප්‍රමාණයක් රු. 2,950 ක ඒකක අනුපාතයකට අලෙවි කරන අතර, එමඟින් මණ්ඩලයට පාඩුවක් සිදු වේ. | එකඟ වේ. පසුගිය ටෙන්ඩරය (LV/S/Fly Ash/003) සම්පූර්ණ කිරීමෙන් පසු සහ නව ටෙන්ඩරයේ අමාත්‍ය මණ්ඩල තීරණය සමඟ සිදු කරන ලද වැඩ. | ප්‍රසම්පාදන ආයතනය සඳහා හිතකර කොන්දේසි සහිතව ගිවිසුම්වලට එළඹීම සහතික කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 06 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘතියසඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. NCRE ව්‍යාපෘතියසඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින | සාමාන්‍යයෙන්, ඉහත සඳහන් සියලු ව්‍යාපෘතිවල ප්‍රගතිය කොවිඩ් -19 සංචාරක සීමාවන් සහ 2022 වර්ෂයේ සිට රට තුළ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් අඩාල විය. එබැවින්, මෙම ටෙන්ඩර්වල ලංසු තැබීමේ අදියරේදී ඉදිරිපත් කරන | 2021 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කර ඇති, නිම නොකළ NCRE ව්‍යාපෘතිවල ප්‍රගතිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

දක්වා ආරම්භ කර තිබූ අතර මෙම ධාරිතාවය අතරින් 2024 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 116 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

ලද ගාස්තු අනුපාත මත ව්‍යාපෘතියක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතියසමාගම් දුෂ්කරතාවන්ට මුහුණ දුන් අතර විසඳුමක් ඉල්ලා ඇත. මෙම කාරණය අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලද අතර, අමාත්‍ය මණ්ඩල තීරණ සහ විදුලිය මිළදී ගැනීමේ ගිවිසුම්වල නියමයන් සහ කොන්දේසි සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘතියඅවලංගු කිරීමට සහ දීර්ඝ කිරීමට ලංවිම පියවර ගෙන ඇත.